# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.05.21

වර්ෂ 2019 ක් වූ මැයි මස 21 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මැයි මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් මෙන්ම 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරිදා දින කිතුනුවන්ට එල්ල වූ ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරයෙන් මියගිය අහිංසක සිවිල් වැසියන්ද සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.04.11 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.04.11 දින පැවති මහා සභා වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න නැත්නම් 2019.04.11 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019-04-11 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි,

14 පිටුව

"වැරැල්ලාන වත්ත පාර" ඒක "වැලිකැටිය වත්ත පාර" ලෙස සංශෝධනය විය යුතුයි. එම වචනය ස්ථාන දෙකක සඳහන් වෙනවා. එම තැන් දෙකම සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි,

06 පිටුව

අංක 06 යටතේ තියෙන ගොඩළිඳ වත්ත මාර්ගය නම් කිරීම පිළිබඳව පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. ඒ පාරම ජයසුන්දර මාවත ලෙස නම් කරන්න කියලා මේ සභාවට ලිඛිත යෝජනාවක් ඇවිත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අදාළ වෙන්නේ මේ සභාවට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අංක 08 යටතේ එම පිටුවෙම වක්වැල්ලේ ජනඋදාන ගම්මානයට ප්‍රවිශ්ට වීමට බටුවන්තුඩාව ප්‍රධාන මාර්ගය දෙසට ඉදිකිරීමට යෝජිත වූ අතුරු මාර්ගය ඒක වෙන්දේසි කිරීමට යෝජිත ඉඩමට වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන වෙන්දේසි කතාවක් නෙමෙයි මන්ත්‍රීතුමා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකේ වෙන්දේසි කතාවක් නෑ. මට මෙතනදී කියන්න අවශ්‍ය, මම එදත් ඒ ගැන අදහස් ප්‍රකාශ කරා. මේ පාර දානකොටම එතන තියෙන ඉඩමක් වෙන්දේසි කරන්න දාලා තියෙනවා. එච්චරයි මට ඒකේ කියන්න අවශ්‍ය වුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මාර්ගය නෙමෙයි මේ. මේ පාර සමරතුංග මහත්තයාලගේ ඉඩමෙන් යන පාරක්. මේ පාර අතනට සම්බන්ධයක් නෑ. මේ පාර යන්නේ ජන උදාන ගම්මානයට. අර පාර එන්නේ අක්කර පහෙන් පල්ලේහාට. ඒක පන්සලෙන් එහා පැත්තේ පාර. මේක පන්සලෙන් මෙහා පැත්තේ පාර.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 10 පිටුව

"නිලධාරීන් විදියට දාලා ඉන්න අය හැරි හැරී ඉන්නවා." ඒක "නිලධාරීන් විදියට දාලා ඉන්න අය වැඩ නැතුව හැරි හැරී ඉන්නවා."ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාටම සුභ උදෑසනක්. මම සතුටු වෙනවා සභා වාර්තාවේ සභාව ඝෝෂාකාරි විය කියන එක නැති එක ගැන. ඒක එහෙම වෙන්න ඕන. ඝෝෂාකාරි කියලා සඳහන් වුනාම සභා වාර්තාවේ අපිට පැහැදිලි කිරීමක් කරන්න බෑ. ඒ නිසා මම සතුටු වෙනවා මේ සභා වාර්තාවේ සභාව ඝෝෂාකාරි විය කියලා සඳහන් නොවන එක ගැන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මමත් සතුටු වෙනවා එන්න එන්නම සභා වාර්තාවේ අඩුපාඩුකම් අවම වෙනවා. සභාවේ තිබුණ ලොකුම ගැටලුවක් තමයි සභා වාර්තාව පිළිබඳ ප්‍රශ්නය. ඒක අවමවීම පිළිබඳ සභාපතිවරයා විදියට මම සතුටට පත්වෙනවා. මන්ත්‍රීවරු සහයෝගය දීම මත තමයි ඒ අඩුපාඩුව අවම කරගන්න හැකියාව ලැබෙන්නේ. සභාව ඝෝෂාකාරි වුනාම සභා වාර්තාව සකස් කිරීමේ අපහසුතාවයට පත් වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා අපි කමිටු වලට සම්බන්ධයක් නෑ. නමුත් රමේෂ් මහත්තයා ඒ වැඩේ හොඳට කරනවා. හැබැයි එකක් තියෙනවා අපි සම්බන්ධයක් නැති නිසා මොන විදියට ලිව්වත් කමක් නෑ. අපි ඒකට විරුද්ධයි අපි ඒකේ නැති නිසා. කමිටු වාර්තාව වගේ දේවල් මීට වැඩිය පැහැදිලිව තියෙන්න ක්‍රමයක් හදන්න. මම දන්නවා මගේ අකුරු හොඳ නෑ කියලා. මම පුරුදු වෙලා තියෙන්නේ දඩ බඩ ගාලා ලියාගෙන

යන්න. හැබැයි කාටහරි ඒක ටයිප් කරන්න දුන්නම එයා දන්නවා මම ලියලා තියෙන්නේ මොකක්ද කියලා. ලියන වේගයත් එක්ක අකුරු අපැහැදිලි වෙනවා. ඒක නිවැරදි වෙන්න ඕන. නැත්නම් මේක බැලුවම ලොකු ප්‍රශ්නයක්. අපි මේක බලන්න ඒ තරම් උනන්දුවක් වෙන්නේ නෑ. හැබැයි අපි බලාගෙන ඉන්නවා කවද හරි දවසක ප්‍රශ්නයක් ආවම ඒවා ගන්න. මොකද අපි විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 2019.04.11 දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කරන්න මම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.04.11 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු ඉඩම් අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා විසින් අද දින මට කැඳවීමක් කරලා තියෙනවා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන කාර්යාලයට මෙහේ තියෙන ඉඩම් පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරන්න. ඒ රැස්වීම පස්වරු 02.00 ට තියෙන්නේ. මට නියෝජිතයෙක් යවලා බෑ. ලේකම්තුමාටයි මටයි යන්න තියෙන්නේ. මම හිතුවා නිලධාරියෙක් යවනවට වැඩිය මම ඒකට සහභාගි වුනොත් වැදගත් කියලා. අද සභාවේ අපි අත්‍යවශ්‍ය කරුණු පමණක් සාකච්ඡා කරමු. මම ප.ව. 02.00 වෙනකොට එහෙට යන්න නම්, ප.ව. 12.00 ට වත් සභාවේ වැඩ කටයුතු අවසන් කර ගන්න උත්සාහ කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම රැස්වීමට විපක්ෂ නායක කියාස් මන්ත්‍රීතුමාටත් එන්න කියලා දැනුම් දීලා තියෙනවා. මම හිතනවා එතුමත් යන එක හොඳයි කියලා. ඔබතුමා එතුමාවත් එක්ක ගෙන යන්න. වෙන දෙයක් නෙමෙයි සිට්ට්‍රස් වත්තෙන් ඉඩම් අක්කර 05 ක් ලබා ගැනීම පිළිබඳ කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හා යමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම වෙනුවට ඩඩ්ලි මන්ත්‍රීතුමා නියෝජනය කරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමක් නෑ කවුරු හරි එන්න.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** දකුණු පළාත පුරා ක්‍රියාත්මක කඩිනම් ඩෙංගු මර්දන වැඩසටහන - 2019 (සේනක පල්ලියගුරුගේ මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත.)

ඩෙංගු මර්දන ව්‍යාපෘති ගැන දැනුවත් කරන්න තමයි එම ලිපිය සභාගත කරේ.

**02.** නිල සෙවණ කාර්යාලය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. - අංක 123/සී අබේසුන්දර වත්ත ග්‍රාම නිලධාරි වසම (ලලින්ද්‍ර ගමගේ මයා, ප්‍රාදේශීය ලේකම්, බෝපෙ පෝද්දල.)

මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ගේ අදහස මොකක්ද?. ඒක ගැන මගේ එකඟතාවයක් තියෙනවා. ඒකට ගමේ අයගේ විරෝධතාවයක් නැතුව ඇති නේද?

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** ගමේ අයගේ විරෝධතාවයක් නෑ ඒකට. ඒකේ අඩුපාඩුවක් තියෙන නිසා මේ ලැබුණු අවස්ථාවෙන් ඒක කරමු අපි.

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමීය මට්ටමේ රාජකාරියේ නියුතු නිලධාරීන් සඳහා කාර්යාලයක් එක් ස්ථානයක ඉදිකිරීම යටතේ නිල සෙවණ මධ්‍යස්ථානයක් 123/සී අබේසුන්දර වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අප ප්‍රාදේශීය සභාව සතු අබේසුන්දරවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය මගින් නඩත්තු කරනු ලබන අපේගම ප්‍රජා ශාලාවේ කොන්ක්‍රීට් තට්ටුව මත ඉදිකිරීමට අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ගොඩළිඳ වත්ත ප්‍රවේශ මාර්ගය ''ජයසුන්දර මාවත'' ලෙස නම් කිරීම. (ගරු ලේකම්, මිහිසර මිතුරු සංසඳය, ගොඩළිඳ වත්ත, හපුගල, ගාල්ල.)

ගොඩළිඳ වත්ත මාර්ගය ජයසුන්දර මාවත ලෙස නම් කරන්න කියලා ඉල්ලලා තියෙනවා. අපි ගිය සභාවේදී ඒකට තීන්දුවක් අරන් තියෙනවා ගොඩළිඳ වත්ත මාර්ගය විදියට නම් කරන්න කියලා. මගේ අදහස නම් මේ නම් දෙකම දාලා මෙහෙම යෝජනා දෙකක් ඇවිල්ලා තියෙනවා කියලා විරෝධතා කැඳවන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි එහෙම නම්කරන්න තීන්දුවක් ගත්තට තාම පාර නම් කරේ නෑ නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ නම් දෙකටම විරෝධතා කැඳවන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයාලා ඉඩම පරිත්‍යාග කරලා තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වටිනවා. ගමේ ප්‍රධාන සමිතියෙන් මේ ඉල්ලීම කරලා තියෙන්නේ.

2019 අප්‍රේල් මහ සභා රැස්වීමේදී ගොඩළිඳ වත්ත ප්‍රවේශ මාර්ගය ''ගොඩළිඳවත්ත මාර්ගය'' ලෙස නම් කිරීමට මහ සභාව තීරණය කර ඇති බැවින් හා මෙම සමිතිය මගින් කර ඇති ඉල්ලීමද සලකා බලා ගොඩළිඳවත්ත ප්‍රවේශ මාර්ගය ''ගොඩළිඳවත්ත මාර්ගය'' සහ ''ජයසුන්දර මාවත'' නමින් නම් කිරීමට විරෝධතා කැඳවා අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදු විය.)

**04.** ජනගහනය සීමා කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභා මට්ටමින් යෝජනාවක් සම්මත කිරීම. (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විහාරාධිපතිවරු)

මෙතන මේ තිදෙනෙක් කියන එක තියෙන්නේ, සිවු දෙනෙක් කියන එක නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දන්නේ කොහොමද සිවුදෙනෙක්ද?, තිදෙනෙක්ද කියන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැවත කතා කරලා ඇහුවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, මේ ගැන මම පොඩ්ඩක් කතා කරන්න ඕන. මේ ප්‍රශ්නයට ජාතිවාදයක් එකතු කරන්න නරකයි මේ රටේ තියෙන ප්‍රශ්නයත් එක්ක. අපිට දැන් විල්පත්තුව අහිමි වෙලා ගිහිල්ලා තියෙනවා. සිංහරාජයත් එළිවෙන තත්ත්වයක් තමයි දැන් ගිහින් තියෙන්නේ. වන හානිය නිසා අපිට කියලා සම්පතක් නැති වෙනවා. අපිට මේ රටේ ඉන්න බැරි තත්ත්වයක් උදා වෙනවා. අන්න ඒ හේතුව මත මේ ගැන රටේ කතා කරනවාට මම හරි කැමතියි. අපේ ගරු සභාව මේ තීරණයට එකඟතාවය ලබා දුන්නොත් ඉතා හොඳයි මේ සිදුවන පරිසර හානියත් එක්ක. ලංකාවේ හැම පුරවැසියෙකුටම ගෙයක් ගෙයක් ගානේ හදන්න ගියොත් ජනගහනය සීමා නොකර බිම් ප්‍රමාණයක් නැති වෙලා අපිට මේ රටේ ඉන්න බැරි තත්ත්වයක් මතු වෙනවා. ඒක නිසා තමයි මේ තීරණය අරගෙන තියෙන්නේ. මේක ජාතිවාදී ප්‍රශ්නයක් විදියට කිසිසේත්ම දකින්න අවශ්‍ය නෑ. මේක පරිසරය පැත්තෙන් බුද්ධිමත්ව බලන්න. ඕනම කෙනෙකුට මේ රටේ මේ තත්ත්වය ඉදිරියේදී උදා වෙනවා කියලා පේනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මාත් මේකට යම් අදහසක් දක්වන්නම් මොකද මේක ගැන ජාතිවාදයකින්, ජාතිභේදයකින් තොරව තමයි මේ කතා කරන්නේ. මොකද මීට අවුරුදු 20 කට විතර කලින් වර්ෂ 2000 දී පමණ උගතුන් ප්‍රකාශ කළ කාරණාවක් තමයි පවුල් ඒකකය දරුවන් දෙදෙනෙකුට සීමා කරන්න කියන එක. දැන් අපේ ගෞරවණීය ස්වාමීන්

වහන්සේලා ඉල්ලනවා දරුවන් තිදෙනෙකුට සීමා කරන්න කියලා. එතන ති අකුර කපලා සිවු දෙනෙකුට කියලා වෙනස් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒක ගැන විමසුවා. සිවු දෙනෙක් වැරදියි. තිදෙනෙක් තමයි නිවැරදි කියලා උන්වහන්සේලා දැනුම් දුන්නා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ః-** මේක හොඳ යෝජනාවක් කාලීන අවශ්‍යතාවයක් සියලු ආගම්, ජාති භේදයකින් තොරව අපේ ලංකාවටම ගැලපෙන විදියට ළමයි තිදෙනෙකුට සීමා කිරීම වඩා කාලෝචිතයි කියලා මම අදහස් කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, අවසරයි මට මේක ගැන කියන්න තියෙන්නේ වෙනත් විදියේ අදහසක්. මොකද හේතුව මම දන්නේ නෑ කියන්න අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලා මේක එව්වේ. මම හිතන්නේ මේකට තවත් අඩුම තරමේ මේ ස්වරූපය වෙනස් කරන්න සාමාන්‍ය මිනිස්සු නෙමෙයි ප්‍රභූවරුන්, ගම්වල තියෙන සමිතිවල ප්‍රධානීන්ගේ අත්සන් ඇතුලත් වුනා නම් ඒකේ තව තියෙනවා පිළිගැනීමක්.

මම මේ කියන්නේ ජාතිවාදය අවුස්සන්න නෙමෙයි. ඒක මහා ගිනි පුපුරක්. දැන් ඒක පුපුරලා කොහෙන් ඉවර වෙනවද දන්නේ නෑ. මේ අවස්ථාවේදී මම කියන්න ඕන ඇත්තටම අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලා අපේ ගෞරවය ආරක්ෂා කරා. මේ අවස්ථාවේදී හැසිරීම හොඳයි. ඒ වෙලාවේදී අපිට ඒ ක්‍රිස්තියානි පූජකවරුන් ලබා දීපු ආදර්ශයෙන් බැහැර වෙන්න බැරි වුනා. නිකං උපකල්පනය කරලා බලන්න පන්සලකට මේ වගේ දෙයක් වුනා නම් ඒක ලේ විලක් ඇත්තටම. ඒක තමයි සත්‍යය. මේ දූෂ්‍යයින්, මේ පවුකාරයින්, මේ පාපිශ්‍යයින් ඉන්නවා හැම ආගමකම. හැම ආගමකටම අපි ගරු කරන්න ඕන.

මේ ප්‍රශ්නයේදී දැන් දකින්නේ පරිසරය ගැන. පුද්ගලිකව ගත්තොත් අපේ නිවාස ඉදිකිරීම් ඇමතිතුමාගේ වැඩ පිළිවෙල ගැන මගේ ප්‍රසාදයක් නෑ. මොකද හේතුව තිරස් අතට ලෝකයේ ගෙවල් හදන්නේ නෑ. එතුමගේ තාත්තා පවා උඩට ගෙවල් හදාගෙන ගියේ. භූමිය කියන එක ලියලන්නේ නෑ. ඉන්දියාව උදාහරණයකට ගන්න. අපි ඉන්දියාවට ගියපු වෙලාවේ දැක්කේ සුළු කොටසක්. මුම්බායිවල අපි දැක්කේ ශාරුක් ඛාන්ගේ ගෙදර විතරයි. මේ සභාපතිතුමා, සුගත් මන්ත්‍රීතුමා අපි කවුරුත් ගියානේ. ලෝකය ගැන ඒ අය දුරට හිතනවා. එහෙම තමයි ඒ අය වැඩ කරන්නේ. එහේ සාමාන්‍ය ගෙයක් හදන්න ගියාම ගේ හදනවා වගේ විශාල මුදලක් බදු වශයෙන් ගෙවන්න ඕන.

ළමයි පිළිබඳ ප්‍රශ්නයේදී නම්, මේ යෝජනාවෙන් අනියම් ආකාරයෙන් කියනවා ගබ්සා කරන්න කියලා. එහෙම නැතුව මේ සමාජයේ ඉන්න අයට මහා දැනුමක් නෑ උපත් පාලනය පිළිබඳ. ශුද්ධ සිංහලෙන් කියනවානම් මාස් ශුද්ධිය වෙලා දවස් කීයකට කලින් කොහොමද ඉන්න ඕන. ඊළඟට අනෙක් උපත් පාලන ක්‍රම සහ බෙහෙත් පාවිච්චි කරන ආකාරය ගැන දැනුවත් නෑ.

දැන් මෙතන ඉන්න අය අරගෙන බලන්න. දරුවන් තුනක් හදන්න කියලානේ කියන්නේ. මම දැන් මේ නිකන් උදාහරණයකට අහන්නේ සමාවෙන්න ඕනා මට, ගරු සභාපතිතුමාට ළමයි කී දෙනාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** දෙදෙනයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** උප සභාපතිතුමාට ළමයි කී දෙනාද?

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ః-** දෙදෙනයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** එකතුව හතරයි. කියාස් මන්ත්‍රීතුමාට ළමයි කීදෙනාද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ః-** හතර දෙනයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ః-** එකතුව අටයි. මගේ ළමයි පස් දෙනෙයි. මුළු එකතුව 13 යි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒක තමයි විරුද්ධ. මෙතුමා මේකට විරුද්ධ මේ හේතුව නිසා තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම සන්තෝෂ වෙනවා ආයේ කතාවක් නෑ. ඒක හැබැයි අර ජාතිය වැඩි කරන්න කියන සංකල්පයෙන් නෙමෙයි මම සන්තෝෂ වෙන්නේ. ඔබතුමා මේ විවාහක මන්ත්‍රීවරුන්ට ඉන්න ළමයින්ගේ එකතුව අරගෙන බෙදලා බලන්න විවාහක මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවෙන්. සාමාන්‍යය තුනක් එන්නේ නෑ. ඒක හින්දා මම දකින්නේ රට ගිනි ගහලා දැවෙන වෙලාවක මේ යෝජනාව ගේන්න එපා. අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේලාට මේක තෝරලා දෙන්න. අපේ ආගමට, අපේ ධර්මයට අපි ගරු කරනවා. විවාදයකට යන කතාවක් තියෙනවා නම් මීට වැඩිය දෙයක් ලෝකය පෙන්වලා කියන්න පුළුවන්. අපේ ශ්‍රම ඒකක කොහෙන්ද එන්නේ. රටක් විදියට කොහොමද දියුණු වෙන්නේ. අපි එහෙම කරා කියලා බෑ. ලෝකෙත් මේවාට පාලනයක් තියෙනවා.

මම නම් දකින්නේ ගරු සභාපතිතුමනි මේක ගැන කියන්න දෙයක් නෑ. තමන් තමන්ම පාලනය වෙයි. හැබැයි මේක මම බෞද්ධ කියන විරෝධාකල්පයක් නෙමෙයි කරේ. මම බෞද්ධයෙක්. මට හැමදාම පන්සල් යන්න බෑ. මම පන්සිල් අරගෙන තියෙනවා. මම නිතරම ඒක රකින්න බලනවා. මම ධර්මය තුළ දකින්නේ පන්සිල් එක පාරක් ගන්න. ඒක රකින්න. නමුත් අපි පන්සිල් ගන්නවා ඒක කැඩෙනවා. එහෙම තමයි යන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔබතුමා මංගල ඇමතිතුමා වගේ බෞද්ධයෙක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව අද ඒක ගැන කතා කරනවා. මම දැන් ඒක ගැන කතා කරන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ අවශ්‍ය නෑ. අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔබතුමාට වෙනස් මතයක් තියෙනවා. ඔබතුමා ඒක සෘජුව දරනවා. මේ ස්වාමීන් වහන්සේලා මේ ලිපිය ඉදිරිපත් කරන කොටම මම දන්නවා මේක ගැන අබේසේකර මන්ත්‍රීතුමාගේ මතය. මොකද ඔබතුමයි මමයි දීර්ඝ කාලීනව ආශ්‍රය කරපු නිසා මේක ඉදිරිපත් වෙනකොටම ඔබතුමාගේ මතය මම දන්නවා. ඒක ගැන සඳහන් වෙන්න ඕන. මේකේ නිශ්චිත අරමුණක් තියෙනවා. මේක මේ වෙලාවේ ගෙනාපු එකේ ගැටලුවකුත් තියෙනවා. මේකේ අරමුණ ඔබතුමා කියන ආකාරයට නෙමෙයි. මේක මුස්ලිම් ජනතාව අපහසුතාවයට පත් කරන්න ගෙනාපු එකක් නෙමෙයි. ලංකාවේ ඉඩම් ප්‍රමාණය වැඩි වන්නේ නෑ. සංඛ්‍යා ලේඛන අනුව බැලුවහම මීට අවුරුදු 100 කට කලින් ලංකාවේ ජනගහනය ලක්ෂ 20 යි. මීට අවුරුදු 60 කට කලින් ලංකාවේ ජනගහනය ලක්ෂ 100 යි. අද වෙනකොට ලංකාවේ ජනගහනය ලක්ෂ 220 ක් වෙලා තියෙනවා. ලංකාවේ ජනගහනය සීඝ්‍ර ලෙස වර්ධනය වෙනවා. ලංකාවේ ජනගහනය වර්ධනය වෙන කොට ඉඩම් ප්‍රමාණය වර්ධනය වීමක් සිදු වන්නේ නෑ. චීනයේ වගේ රටවල එක ළමයයි හදන්න පුලුවන්. දැන් ළමයි දෙන්නයි. ඒ පිළිබඳ ගෙනාපු යෝජනාවක් හැටියට තමයි අපි මේක සලකන්නේ. එකේදී කියාස් මන්ත්‍රීතුමාට අදහස් දක්වන්න අවස්ථාව ලබා දෙන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව කුමන අරමුණෙන් ගෙනාවත් අපිට ප්‍රශ්නයක් නෑ. නමුත් මේක මධ්‍යම රජයට කරන්න ඕන යෝජනාවක්. මධ්‍යම රජයකින් මෙවැනි යෝජනාවක් ගෙනාවොත් ඒක වැළඳගන්න අපි සූදානම්. අපේ ඉස්ලාම් ආගමේ කියලා තියෙන්නේ ඕනෑම රජයක් ගේන යෝජනාවක් අනුව මධ්‍යම රජයේ නීතියට අනුයුක්ත වෙන්න ඕන කියන එක. මධ්‍යම රජයෙන් මෙවැනි යෝජනාවක් ගෙනාවොත් ඒකට අනුව ක්‍රියාකරන්න අපි බැඳිලා ඉන්නවා.

මෙතනදි පරිසරයට හානි වෙන නිසා ජනගහනය සීමා කරන්න ඕන කියලා යෝජනාවක් ගේනවා. නමුත් පාරේ යන්න බෑ. වාහන වැඩියි ලංකාවේ. ජනගහනයට වඩා වාහන ලංකාවේ තියෙනවා. වාහන වැඩි නිසා වාහන අවම කරන්න කියලා යෝජනාවක් ගෙනාවම විපක්ෂය මොකද ඒකට කිවුවේ. වාහන සීමාකරන්න කියලා යෝජනාවක් ගෙනාවම අපේ මුදල් ඇමතිතුමාට විරුද්ධ වුනා. එතනදී වාහන වලිනුත් පරිසරය දූෂණය වෙනවා. ඒක නෙමෙයි මම මෙතන කතා කරන්නේ. ඒකත් සාර්ථක යෝජනාවක්. ඕනම ආණ්ඩුවක්, මධ්‍යම රජය මෙවැනි යෝජනාවක් ගෙනාවොතින් ඒ යෝජනාව අනුව අපි කටයුතු කරනවා. අපේ ආගම අනුව දරුවන් කියන්නේ දෙවියන් වහන්සේගෙන් ලැබෙන දායාදයක්. ඕන තරම් මව්වරු, පියවරු දුක් වෙනවා දරුවන් නෑ කියලා. දරුවන් ලැබෙනවා කියන්නේ දෙවියන් වහන්සේගෙන් ලැබෙන දායදයක්. ඒ දායාදය දෙවියන් වහන්සේ විසින් තමයි ලබාදෙන්නේ. දරුවෝ ලැබෙන කොටම මැරෙන අයත් ඉන්නවා. දරුවන් හම්බවෙන්නෙම නැති අයත් ඉන්නවා. එතනදී රජය යම්කිසි සීමාවක් පැනෙව්වොත් ඒකට අපි ගරු කරනවා.

මගේ බිරිඳටත් දරුවන් හතර දෙනෙක් හම්බවුනේ මුල් ළමයි දෙන්නා නිවුන්නු නිසා. නැත්නම් මටත් ළමයි තුන්දෙනයි. සිසේරියන් සැත්කම් නිසා එහෙම වුනේ. සිසේරියන් සැත්කම කරන්න කිවුවොත් ඒක කරන්න වෙනවා. එතකොට අපි සිසේරියන් සැත්කම කරන්න බෑ කියලා බලපෑම් කරලා නෑ. සිසේරියන් සැත්කම කරන්න ඕන වුනාම ඒක කරනවා. එහෙම වුනාම ළමයි තුන් දෙනයි හදන්න පුළුවන්. මට පළවෙනි පාර නිවුන්නු හම්බ වුන නිසා ළමයි හතර දෙනෙක් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ යෝජනාව සම්මත කරලා පාර්ලිමේන්තුවට යවන්න කියලා තියෙන්නේ. මම හිතන්නේ නම් මේකේ ගරු ස්වාමීන් වහන්සේලා දැකපු කාරණා දෙකක් තියෙනවා. එකක් තමයි අද වෙනකොට ගොඩක් ළමයි පාරේ හිඟා කනවා. දෙමව්පියන්ටත් ළමයි හදන්න බැරුව හදන්නන් වාලේ හදනවා. ළමයි බහුතරයක් පාරේ හිඟා කන මට්ටමක් තියෙන්නේ. ඒක එක කාරණාවක්. අනිත් එක වර්තමානයේ මේ රජය ගෙනියන වැඩ පිළිවෙල යටතේ ඇත්තටම ළමයින්ට කන්න බොන්න තියා දෙමව්පියන්ටවත් කන්න බොන්න නැති තත්ත්වයක් තමයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. ඒක තුළ දරුවෝ තවත් හදලා බෑ. මේ රජය ගෙනියන වැඩපිළිවෙල තුළ දරුවන්ට තියා දෙමාව්පියන්ටවත් ජීවත්වෙන්න බැරි තත්ත්වයක් තමයි නිර්මාණය වෙන්නේ. ඒක හිතලා බලලා ගෙනාපු යෝජනාවක් විදියට තමයි මම මේක දකින්නේ.

ශ්‍රී ලංකා භූමියට ඔරොත්තු නොදෙන තරම් ජනගහනයක් දැනටමත් අප රට තුල වර්ධනය වී ඇති බැවින් ශ්‍රී ලංකාව තුල සෑම ජනවර්ගයකටම අදාළ එක් පුරුෂයෙකුට හා එක් ගැහැනියකට දරුවන් තිදෙනෙකුට පමණක් පීතෘත්වය හා මාතෘත්වය සැපයිය හැකි සේ නීතියක් පැනවීමටත්, ඒක අපි පාර්ලිමේන්තුවට දන්වා යැවීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ඒ අයගේ මතය වෙනස් වෙන්න පුළුවන්. මොන ගැටළුව පැන නැගුනත් ගරු ස්වාමීන් වහන්සේලාගේ යෝජනාව ඒකමතිකව හෝ ඡන්දයක් තියලා හෝ සම්මත කළ යුතුයි. මේ වාතාවරණය තුළ කන් වලට බොහොම අමිහිරි කතා ඇහෙන්නේ. සිංහල බෞද්ධ රටක අපි ජීවත් වෙනවානම් මේ ගරු ස්වාමීන් වහන්සේලාගේ යෝජනාව මේ ගරු සභාවේ සම්මත කරලා මධ්‍යම රජයට ඉදිරිපත් කරලා එතනින් යම් නීතියක් ගේනවා නම් ඒ නීතිය වෙනුවෙන් මේ යෝජනාව මේ සභාවේ සම්මත කළ යුතුයි. විරුද්ධ නම් ඡන්දෙකට ගිහින් හරි මේ යෝජනාව සම්මත කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මට්ටමේ විරෝධතාවයක් පළ වුනේ නෑ නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමතියි නැවත වරක් මේක සිංහල බෞද්ධ රටක්ද කියලා. දෙවනුව මම අදහස් දක්වන්නම් අපේ මන්ත්‍රීතුමා කිවුවා වගේ එතුමාගේ ආගමේ තියෙන්නේ දරුවන් ලැබෙන්නේ දෙවියන් වහන්සේගෙන් ලැබෙන දායදයක් වශයෙන් කියලා කියපු කතාව සම්බන්ධව. අපේ සිංහල බෞද්ධ ආගමේ හැටියට පිරිමියෙක් හා කාන්තාවක් එක්වීමෙන් ශුක්‍රාණුවක් හා ඩිම්බයක් සංසේචනය විමෙන් තමයි දරුවෙක් උපදින්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අද දන්නේ ඒක.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** චීනයේ ජනගහනය වැඩි නිසා තමයි දරුවන් සෑදීම සීමා කරලා තියෙන්නේ. දැන් දරුවන් දෙදෙනෙක්ද කොහෙද හදන්න පුළුවන්. මම හිතන්නේ ලංකාව වගේ රටකට, වර්ග කිලෝ මීටර් 65,610 ක් තියෙන මේ භූමි ප්‍රමාණයට මේ ජනගහනය ඇත්තටම සීමා කළ යුතුයි. සිංහලයෝ ළමයි දෙන්නෙක්ට සීමා කරන කොට වෙනත් ජනවර්ගවල අය ළමයි 10 ක් 15 ක් හැදුවා. ඉතිං ඇත්තටම ජනගහනය වැඩිවීමක් වෙලා තියෙනවා. සිංහල බෞද්ධ රටක් වුන ලංකාවේ මුලින් කිවුවේ සිංහල මහ ජාතිය කියලා. නමුත් දැන් ටික ටික සුළු ජාතිය බවට පත් වෙනවා. මම මේ කියන්නේ ජාති ආගම් විරෝධයක් නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම කිවුවහම ඒකෙන් අදහස් වෙන්නේ ඒක තමයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඔබතුමා පළමුවෙන්ම කියන්න මේක සිංහල බෞද්ධ රටක්ද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් අනිවාර්යයෙන්ම. ඔබතුමා දරන මතය හරි. නමුත් අපිට සභාවක් විදියට මේ මතය දරන්න බෑ. අපි මහජන නියෝජිතයෝ විදියට, සභාවක් විදියට එහෙම යන්න බෑ. අපේ රට සිංහල බෞද්ධ රටක්. මම බෞද්ධාගමිකයෙක්. ඒක මගේ පුද්ගලික මතය. පුද්ගලික මතය මම මේ ප්‍රකාශ කරන දේට වඩා වෙනස් වෙන්න පුළුවන්. නමුත්

අපිට පොදුවේ මහජන නියෝජිතයෝ විදියට අපිට කියන්න බෑ මේ රට බෞද්ධ රටක්. මේ රටේ බෞද්ධයන්ට විතරයි ජීවත් වෙන්න පුළුවන් කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මේ කියන්නේ බොහොම පැහැදිලි ස්ථාවරයෙන්. මේක සිංහල බෞද්ධ රටක්. නමුත් අපිට කියන්න බෑ මේ රටේ සිංහලයන්ට මේ තැන දෙන්න ඕන කියලා. මහජන නියෝජිතයෝ විදියට අපිට කියන්න බෑ. විශේෂයෙන්ම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සහෝදරයෝ වගේ අපි ජීවත් විය යුතුයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඒකෙන් අදහස් කරේ ඒ දේ නෙමෙයි. සියලු ජාතීන්ට ජීවත් වීමේ අයිතිය තිබිය යුතුයි. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ හැම ජාතියකටම ජීවත් වීමේ අයිතියක් තියෙනවා ශ්‍රී ලංකාව ඇතුළත. නමුත් මේක සිංහල බෞද්ධ රටක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. අපේ කාදිනල්තුමත් කියනවානේ. ඒකේ තර්කයක් නෑ. මම හිතන්නේ නෑ කියාස් මන්ත්‍රීතුමා වුනත් ඒකට විරුද්ධ වෙයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි හැමෝටම පොදු මතයක් තියෙනවා. අවුරුද්දකට මාස 06 කට විතර උඩදි මේ ප්‍රශ්න නෑ. කාදිනල්තුමා ප්‍රකාශයක් කරා මේක බෞද්ධ රටක් කියලා. ගෝත්‍රිකවාදී අදහස් මේ ගේන්නේ. ආගම කියන්නේ අපේ පෞද්ගලික දෙයක්. මෙතුමා මුස්ලිම් වෙලා තියෙන්නේ එතුමාට ඒක අදහන්න අයිතිය තියෙන නිසා. හින්දු ආගම අදහන අයටත් ඒ අයිතිය තියෙනවා. මොන ආගම ඇදහුවත් ඒ අයිතිය තියෙනවා. කවුරු මොනවා කිවුවත් කාදිනල්තුමා ඉතා නිවැරදි මත ප්‍රකාශ කරේ. එතුමාට ඒ විදියට හැසිරෙන්න පුළුවන්කම තිබුණා. අපේ පන්සලක මේ වගේ දෙයක් වුනානම් අපේ හාමුදුරුවෝ වැරදි විදියට හැසිරෙන්නේ. කාදිනල්තුමා විශාල කොටුවක ඉන්නේ. එයාට ඒ කොටුවෙන් එහාට ගිහින් අදහස් ප්‍රකාශ කරන්න බෑ. එහෙම වුනොත් කතෝලික සමාජයේ ඊළඟ සංස්ථාව ඒකට ක්‍රියාමාර්ග ගන්නවා. අපේ හාමුදුරුවරු මොන පිස්සුවක් කෙළියත් ඒකට ක්‍රියාමාර්ග ගන්න කෙනෙක් නෑ. අපේ ධර්මය පිළිබඳ කාටවත් තර්ක කරන්න දෙයක් නෑ. බැලුවම විද්‍යාඥයෝ කරපු දේවල් තියෙන්නේ. ඒ වගේම තමයි යේසුස් වහන්සේත්, ඒ වගේම තමයි මුහම්මත් මොහොමඩ් කියන්නෙත්. ඒක නිසා මේ වැඩක් නැති දේවල් පටලවාගෙන. මේක කාලීන යෝජනාවක්ද. යෝජනාවක් කරන කොට වෙලාවක් තියෙනවා. මේක මේ වගේ යෝජනා කරන වෙලාවක්ද. රට ගිනි අරගෙන තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හාමුදුරුවෝ ගැන මොකක්ද කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හාමුදුරුවෝ ගැන කියන්නම් මම වෙනම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන මේ අනවශ්‍ය මාතෘකාවකට යන්නේ. මෙතන ගෙනාපු යෝජනාව ගැන අපි කතා කරමු. මෙතන ගෙනාපු යෝජනාවේ අදහස අපිට වැඩක් නෑ. අපිට අවශ්‍ය සභාවක් විදියට රටේ ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වෙනවා. අපේ භූමි ප්‍රමාණය ඒ හා සමානුපාතිකව වර්ධනය වෙන්නේ නෑ. ඒක තුළ ඒ අදහස් පිළිබඳ අපිට අදාළ නෑ. ඒ යෝජනාව ඇවිල්ලා තියෙනවා. අපි ඒ යෝජනාව පිළිබඳ සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවට යොමු කරමු. මේක මේ අනවශ්‍ය මාතෘකාවක්. ඔබතුමා කියන කතාවෙත් ඇත්තක් තියෙනවා. අපි මේ සංවාදය ජාතීවාදි පැත්තකට ගෙනියන්න නරකයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක යෝජනාවක් පාර්ලිමේන්තුවට යන ක්‍රමයට යන්න ඕන. ඒක එතනට යන එක නිවැරදියි. මම විශ්වාස කරනවා මේක ඕන වෙලාවක්ද මේ. හාමුදුරුවන්ට කියන්න මීට වැඩිය ඉදිරිගාමී යෝජනාවලුත් ගේන්න කියලා. වාහන තදබදයක් තියෙනවා රටේ. ඒකටත් ගේන්න කියන්න යෝජනා. වාහන අනවශ්‍ය තරමින් ගෙන්නන එක නතර කරන්න කියන්න. අපේ ආණ්ඩුවේ අය විතරක් නෙමෙයි මේ දෙන හැම වරප්‍රසාදයක්ම අනෙක් අයත් ගන්නවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේක සිංහල බෞද්ධ රටක්. ඒ වුනාට සියලුම ජාතීන්ට මේ රට තුළ ජීවත් වීමේ අයිතිය තියෙනවා. ඒක අපි විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕන. අපේ හාමුදුරුවරු මේ ගෙනාපු යෝජනාවේ අඩු නැතුව යම් දෙයක් කියවෙනවා. එතනදී ජාතිය ගැන කතා කරන්න වෙනවා. සිංහල ජාතිකයටත් ළමයි තුන් දෙනයි. මුස්ලිම් ජාතිකයටත් අනෙකුත් හැම ආගමකම කෙනෙකුටත් ළමයි තුන්දෙනෙක් හදන්න කියලා මේ තියෙන්නේ. ඒ මතය තුල මම මේ යෝජනාවට පක්ෂයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතන්නේ කාටවත් විරුද්ධ මතයක් නෑ. ඒ යෝජනාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මගේ මතය සඳහන් වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමාගේ පෞද්ගලික මතය සඳහන් වෙනවා කොහොමත්.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමාගේ මතය සඳහන් කරමින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වුනා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකමතිකව නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෙදීමක් ඉල්ලන්නේ නැනේ කොහොමත්. ඒ නිසා ඒකමතිකව සභා සම්මතයි.

**05.** වරිපනම් අංක 12/9 ස්ථානයේ හිඟ වරිපනම් ගෙවීම නිදහස් කර ගැනීම. (එන්. ඒ. මිල්රඩ් මෙය, 12/9, පියරතන පටුමඟ, බෝපෙ, ගාල්ල.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම හිතන්නේ මෙහෙමයි. මේ වගේ ඉල්ලීමක් කරන්නේ බැරිකම හින්දා. ඒ මනුස්සයට ඒ අවස්ථාව ලබා දෙන්න. බෝපෙ පෝද්දල ජනතාව නියෝජනය කරන එක්කෙනෙක් තමයි මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාත් ඒක තමයි කියන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේක ඒකමතිකව සභා සම්මත කරමු. මම යෝජනා කරන්නම් මොකද අසරණ වෙච්ච කෙනෙක් මේ.

උක්ත ලිපිනයේ පදිංචි එන්. ඒ. මිල්රඩ් මෙය හට අප ප්‍රාදේශිය සභාවට අය විය යුතු හිඟ වරිපනම් මුදල වන රුපියල් දෙදහස් අටසිය හැට එකයි ශත දහයක මුදල ගෙවීමට හැකියාවක් නොමැති බවට 107/ඒ, බෝපේ උතුර වසමේ ග්‍රාම නිලධාරි සහ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරි විසින් තහවුරු කර ඇති බැවින් දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව එම හිඟ වරිපනම් බදු මුදල පොත් වලින් කපා ඉවත් කිරීමට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම. (කේ. ඊ. ඒ. දයාවතී, අංක 229, නාවින්න, උළුවිටිකේ.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මම හිතන්නේ එයත් ගොඩක් අසරණ වුන කෙනෙක්. ඒ හින්දා ඒකත් නිදහස් කරලා දෙන්න කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා අඩු ආදායම් ලාභියෙක් කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහතික කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මෙයාගේ ඉඩමේ තියෙන ගහ අල්ලපු ගෙදරට අනතුරුදායක ලෙස නැවිලා තියෙන්නේ. මේ මනුස්සයට ගහ කපන්න වත්කමක් නෑ. අර ගෙදර අය ඒක කපලා අයින්කර ගන්නෙත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට සභාවේ විරෝධයක් නෑ නේද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** උක්ත ලිපිනයේ පදිංචි කේ. ඊ. ඒ. දයාවති මියගේ ඉඩමේ ඇති කනත්ත ගමගේ චිත්‍රානි යන අයට ජීවිත හා දේපල වලට හානිදායක දෙල් ගසක අතු කැපීම හා දිරාපත් වූ අත්තික්කා ගස කැපීමට යන වියදම දැරීමට නොහැකි බවට 127 ඊ, නාවින්න

ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී සහ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් තහවුරු කර ඇති බැවින් එම අනතුරුදායක ගස් කැපීමට යන වියදම සභා අරමුදලින් දැරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** තේ කඩ හිමියන් දැනුවත් කිරීමේ වැඩසටහනට මුදල් ඉල්ලීම. (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, බෝපෙ පෝද්දල)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් 2019.06.25 දින පැවැත්වීමට නියමිත තේ කඩ හිමියන් දැනුවත් කිරීමේ වැඩ සටහන සඳහා සංග්‍රහ වියදම් වෙනුවෙන් රු. 10,000/- ක මුදලක් ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** පලාගල කන්ද දෙවන පටුමඟ සංවර්ධනය කිරීම (පලාගල කන්ද දෙවන පටුමගේ ගම්වාසීන්)

එම පලාගල කන්ද දෙවන පටුමඟ සංවර්ධනය කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** කිතුලම්පිටිය අලුත්ගෙදර වත්ත මාවත සංවර්ධනය (කිතුලම්පිටිය අලුත්ගෙදර වත්ත මාවතේ ගම්වාසීන්)

කිතුලම්පිටිය අලුත්ගෙදර වත්ත මාවත සංවර්ධනය කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** මාර්ගයේ අවහිරතාවය ඉවත් කිරීම (බෝපෙ එගොඩකනත්ත වත්ත මාවතේ ගම්වාසීන්)

කොතනද මේ හරියටම, බෝපෙ පන්සල ඉස්සරහ පාරද , සුගත් මන්ත්‍රීතුමා මොකක්ද මේ ගැටලුව?

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරීතුමියත් මේ ප්‍රශ්නය ගිහින් බැලුවා. පාර කොන්ක්‍රීට් කරන කොටම බම්පර් එකක් හැදුවා. ඒ නිසා මේ පවුල් කීපයකට අසාධාරණයක් සිදුවෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගුණරත්න මහත්මයාගේ ඉඩමේ පාර කොනේ මේ ප්‍රශ්නය තියෙන්නේ ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන ඒ බැම්මක් සම්බන්ධ ප්‍රශ්නයක් නේද තියෙන්නේ ? හැබැයි මේකේ කියලා තියෙන්නේ මාර්ගයක් අවහිරවීමක් ගැන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එයා පාරට යන්න හදා ගනිපු එක නිසා අපේ පාරට අවහිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ගැටලුව සම්බන්ධව තාක්ෂණ නිලධාරීතුමියට සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිනී අයි.ඩී. කමණී චන්ද්‍රලතා මහත්මිය පහත අදහස් දක්වන ලදි.

- බෝපෙ එගොඩකනත්ත වත්ත මාර්ගය අවහිරවීම සිදු වී ඇති ආකාරය හා එම අවහිරවීම විසඳීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අවහිරතාවය ඉවත් කිරීම සඳහා සභා තීන්දුවක් ගමු. මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලිපියකින් දැනුම් දෙන්න දිනයක් දීලා ඊට කලින් කඩලා ඉවත් කරන්න කියලා. නැත්නම් ඒක සභාව මැදිහත් වෙලා අයින් කරලා දාමු.

**11.** ඇලබඩ වේදීගේවත්ත මාර්ගයේ ඇති මඩ වල වැසීම. (ඇලබඩ වේදීගේවත්ත මාර්ගයේ ගම්වාසීන්)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අපි ගිහින් බලපු එක නේද?

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරී එක්ක ගිහින් මේ ස්ථානය පරීක්ෂා කරා. ඒ පාර්ශව දෙකම කැමතියි ඒ මඩ වල පස් දාලා උස්සනවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන හැබැයි සෑහෙන ප්‍රමාණයක උසක් තියෙනවා. තමන්ගේ ඉඩමෙන් කාණුවක් දෙන්නම් කිවුවා නේද දෙගොල්ලොම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නැවත වතාවක් තාක්ෂණ නිලධාරී එක්ක ගිහින් පරීක්ෂණයක් කරලා ඉදිරි ක්‍රියා මාර්ග ගමු. ඒ.බී.සී දාලා ඒ පාර උස්සන්න ක්‍රමවේදයක් ගන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ.බී.සී දැම්මොත් පැති බැම්මක් හදන්න වෙනවා. ඒ නිසා ඇලබඩ වේදීගේවත්ත මාර්ගයේ මඩ වල වැසීම සම්බන්ධව තාක්ෂණ නිලධාරි වාර්තාවක් අරගෙන අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** මාර්ගය අවහිරවන සේ ඇති විදුලි කණුව වෙනත් ස්ථානයක සවි කර ගැනීම. (ගිංතොට හිල්ලූර් පල්ලිය පාරේ ගම්වාසීන්)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට හිල්ලූර් පල්ලිය පාරේ අතුරු මාර්ගයක් අවහිරවන සේ ඇති විදුලි කණු වෙනත් ස්ථානයක සිටුවීමට විදුලිබල මණ්ඩලය දැනුවත් කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවෙන් විදුලිබල මණ්ඩලයට ලියුමක් යවන්න. සභාවෙන් දැනුවත් කරොත් ඒක ඒ අය නොමිලේ කරලා දේවී ඒ විදුලි කණුව විදුලිබල මණ්ඩලයට අයිති නිසා.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-** නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස රවීන්ද්‍ර කුමාර ජාගොඩ මහතා මැයි මස සිට පත් කිරීමට යෝජනා කරමි.

ඒ පිළිබඳ අදහස් දැක්වීමක් කරන්න ඕන. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට මහජන සම්බන්ධතා නිලධාරි කෙනෙක් බඳවා ගන්න පුළුවන්. ඒක ගාල්ල දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය සභා සියල්ලෙම කරපු දෙයක්. අපේ ප්‍රාදේශීය සභාවෙත් හිටපු සභාපතිවරුන්ටත්, මහජන සම්බන්ධතා නිලධාරීන් ඉඳලා තියෙනවා. ටෙල්සි ශ්‍යාමලි මෙයත් මාදුගොඩ සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස කටයුතු කරා. සභාපතිවරයාට මහජන සම්බන්ධතා නිලධාරී කෙනෙක් බඳවා ගැනීමට බාධාවක් නෑ. මම මෙතෙක් කල් මහජන සම්බන්ධතා නිලධාරී කෙනෙක් බඳවා ගත්තේ නෑ. නමුත් ඉදිරියේදී මම මහජන සම්බන්ධතා නිලධාරි කෙනෙක් බඳවා ගන්න බලාපොරොත්තු වෙනවා.

ඔබතුමන්ලාට කියන්න ඕන යම් අතපසුවීමක් සිද්ධ වුනා. ඒකේ සම්පූර්ණ වගකීම මට තමයි පැවරුනේ. සභාවේ වෙසක් කුඩු ඔක්කොම එල්ලලා අන්තිමට බල්බ් ටික දාගන්න බැරිවුනා. ඒකෙන් අන්තිමට චෝදනාව එල්ල වුනේ ආයතන ප්‍රධානියා විදියට මට. ඒ වගේ අඩුපාඩුකම් මින් ඉදිරියට සිද්ධ වෙන්න බෑ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කිවුවම මගේ විතරක් නෙමෙයි මන්ත්‍රීවරු විදියට කාටත් වගකීමක් තියෙනවා. අන්තිමට වගකීම ආවේ මට. මම උදාහරණයක් කිවුවේ. ඒ වගේ කටයුතු මට හැම දෙයක්ම ඇඟිලි ගගහ හොයන්න අමාරුයි. ඒක තුළ ඒ කාරණා හොයලා බලන්න කෙනෙක් ඉන්න ඕන. ඒකට තමයි මම මහජන සම්බන්ධතා නිලධාරී කෙනෙක් පත්කර ගන්න මේ යෝජනාව ඉදිරිපත් කරේ. ඒ සඳහා මම සභාවේ අනුමැතිය බලාපොරොත්තු වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා මහජන සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර ගත්තට අපේ විරෝධතාවයක් නෑ. හැබැයි මේ කියන පුද්ගලයාගේ හැසිරීම් රටාව නිසා මම පෞද්ගලිකව මේ යෝජනාවට විරුද්ධයි. ඒ නිසා මම බෙදීමක් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතුව ?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ පුද්ගලයාගේ හැසිරීම් රටාව.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සභාපතිවරයෙකුට මහජන සම්බන්ධතා නිලධාරී කෙනෙක් පත්කර ගන්න හැකියාව තියෙනවා. නමුත් මම කල්පනා කරේ මෙම ගරු සභාවේ බෙදීමකට ගිහිල්ලා දීර්ඝකාලීනව යන ගැටලුවකට සහ අමනාපයකට යනවට වඩා මේක ඇයි ඔබතුමාගේ සභාපති බලතල අනුව තමුන්ට මහජන සම්බන්ධතා නිලධාරීයෙකු පත්කර ගැනීමේ බලය තියෙද්දී ඇයි මේ ගරු සභාවට මේක ඉදිරිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා අරමුදලෙන් මුදල් ගෙවන නිසා සභා තීන්දුවක් ගන්න අවශ්‍යයි. මම කැමති කෙනෙක් යෝජනා කරන්න පුළුවන්. එයාව බඳවා ගන්න සභා තීන්දුවක් ගන්න අවශ්‍යයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කෙසේ හෝ මේ කටයුත්ත සාමූහික එකමුතුව යටතේ සියලු දෙනාගේම කැමැත්ත පරිදි කරන්න ඕන. බෙදීමකට ගිහින් දීර්ඝකාලීනව යන ගැටළුවකට නොගොස් වැඩ කරන්න ඕනේ. මොකද අපි සභාවක් විදියට ඔබතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරියාත් එක්ක සුහදව කටයුතු කරන්න ඕන. අද මේකේදි විරුද්ධ මතයක් දරලා හෙට දවසේ එතුමාගේ සහයෝගය ගන්න අවශ්‍ය වුනොත් අපි යම් කිසි ප්‍රමාදයකට හා පසුතැවිල්ලකට පත්වෙනවා. කාටත් පිළිගන්න පුළුවන් කෙනෙක් වෙන්න ඕන. මේ කියන පුද්ගලයා මාගේ දීර්ඝකාලීන හිතවතෙක්. අපේ දේශපාලන වැඩකටයුතු වලට සෘජුවම සම්බන්ධ වුන කෙනෙක්. ඒ නිසා සියළු දෙනාගේම කැමැත්ත මත මහජන සම්බන්ධතා නිලධාරියෙක් පත්කරගත යුතුයි කියන එකයි මගේ අදහස. මේ ගරු සභාවේ බහුතර මතයට අපිට එකඟ වෙන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමාට සභාවේ අනුමැතිය ලැබුනම මහජන සම්බන්ධතා නිලධාරියෙක් පත්කර ගන්න පුළුවන්. ඊට පස්සේ ඔබතුමාට කැමති කෙනෙක් බඳවා ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ලියනගේ මන්ත්‍රීතුමාගෙන් නෙමෙයි අනෙක් මන්ත්‍රීවරුන්ගෙන්. පත්කරගන්න නිලධාරියා පිළිබඳ සභාව දැනුවත් කිරීමේ යුතුකමක් මට තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ජනතාවගේ බදු මුදල් වලින් මේක ගෙවන්න. ගෞරවනීය පුද්ගලයෙක් මේ තනතුරට බඳවා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව සභාවට ඉදිරිපත් කරේ සභා අරමුදලින් ගෙවීම් කරන නිසා. නමුත් ලියනගේ මන්ත්‍රීතුමාට මේ පුද්ගලයා එක්ක පුද්ගලික ප්‍රශ්නයක් තියෙන්නේ. අනෙක් මන්ත්‍රීවරුන්ට එහෙම ප්‍රශ්නයක් නැනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ සභාවේදී ඒ පුද්ගලයාගේ පෞද්ගලික විස්තර කියන්න මම කැමති නෑ. හැබැයි ඒ විස්තර ටික සභාවේ කියන්න වුනොත් මම කියනවා. පහුගිය කාලේ පත්තර ටික බැලුවනම් මේ පුද්ගලයා ගැන විස්තර දැන ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ මොන පුද්ගලයෝ ගැනද?. ඒ අනවශ්‍ය මාතෘකා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒවා ඇද ගන්නේ නැතුව බේදීමකට යන්න.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** කාගේවත් පෞද්ගලිකත්වයට මේ ගරු සභාවේදී හානි කරන්න එපා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නෑ හානි වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බේදීමක්ද දැන් ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා බේදීමකට යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මරු වැඩ ඉතිං. මේකේ හැම එකටම බේදීම්. මට බඳවා ගන්න ඉන්න මහජන සම්බන්ධතා නිලධාරියාටත් බේදීමක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමාට මහජන සම්බන්ධතා නිලධාරියෙකු පත්කර ගන්නේ එතුමා විසින් ඒ නිලධාරියා සමඟ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ ජනතාවට මීට වඩා ඵලදායි සේවයක් කරන්න. එතනදී වඩා වැදගත් පත්වෙන නිලධාරියා විසින් කරනු ලබන කාර්යභාරය. පුද්ගලයා ''ඒ'' ද, ''බී'' ද කියන එක නෙමෙයි වැදගත්. නිලධාරියා නම් කරන්නේ සභාපතිතුමා විසින්. ඕනම වෙලාවක ගැටලුවක් වුනොත් ඒ නිලධාරියාව අයින් කරන එකෙත් වගකීම තියෙන්නේ සභාපතිතුමාට. ගැටළුවක් ඇති වුනොත් ඕනම වෙලාවක කතා කරලා ඒ පුද්ගලයාව අයින් කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳ නැත්නම් අයින් කිරීමේ වගකීමත් මම ගන්නවා. තමන්ට පුද්ගලිකව අදාළ පුද්ගලයා සමඟ ප්‍රශ්න ඇති. මම කවුරු නම් කරත් ඒ ප්‍රශ්නය එනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ අතිගරු ජනාධිපතිතුමාගේ සිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා දක්වාම පුද්ගලික කාර්ය මණ්ඩලයක් පත්කර හැකි නම් ඒ සියලු කටයුතු අදාළ පුද්ගලයාගේ අභිමතය පරිදි සිද්ධ වෙන්නේ. ඒ නිසා අපි කියන්නේ මේකේ වගකීම සභාපතිතුමා භාරගන්නවා නම් ඒ නිලධාරියා පත්කිරීමට අපි විරුද්ධ නෑ. ඒකට අපි බේදීමක් යන්නේ නැතුව සම්මත කරමු. මේක එක්සත් ජාතික පක්ෂය ඇතුලු විපක්ෂයේ අනෙක් පක්ෂවලටත් විශාල ගැටළුවක් නෙමෙයි මම හිතන්නේ. ඒ නිසා අපි සාමකාමීව මේ ගැටළුව විසඳගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම ගැටළුවක් ඇති වුනොත් අයින්කිරීමේ වගකීම මා සතුයි. මේක ස්ථිර පත්වීමක් නෙමෙයි. ගන්න කෙනාට තව මන්ත්‍රීවරයෙක් කැමති නැති වුනොත් මේ ප්‍රශ්නය හෙටත් එනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, යෝජනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා. එතකොට මහජන සම්බන්ධතා නිලධාරියෙක් පත්කිරීමේදී සභාව දැනුවත් කරන්න ඕන. ඒ නිලධාරියාට ගෙවීම් කටයුතු කරන්නේ සභාවෙන්. එතකොට ඒ දැනුවත් කිරීමේ යෝජනාව ඔබතුමා සභාවට ඉදිරිපත් කරලා තියෙනවා. ඒකට විරෝධය පලකරලා ඛෙදීමක් ඉල්ලලා තියෙනවා. දැන් ඔබතුමා ඒ ඛෙදීම අනුව ක්‍රියාකරන්න. ඒ පුද්ගලයා සුදුසු නැත්නම් වෙන පුද්ගලයෙක් පත්කරගන්න පුළුවන් ඔබතුමාට. එච්චරයි කරන්න තියෙන්නේ. මහ ලොකු ප්‍රශ්නයක් නෑ මෙතන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා** ඃ- සභාපතිතුමා මෙහෙමයි, කොහොම වුනත් දැන් මේ යෝජනාවට විරුද්ධ වෙලා තියෙනවා. විරුද්ධ වෙලා එක මන්ත්‍රීවරයෙක් හරි ඛෙදීමක් ඉල්ලනවා නම් මට එකක් කියන්න පුළුවන් මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්න. එහෙම නැත්නම් ඛෙදීමකට යන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මට ඕන කෙනෙක් පත්කරගන්න බැරිනම් මම පැරදුනත් ඒ යෝජනාව ගේනවා. මේක පොදුවේ සභාවට අදාළ කාරණාවක් නෙමෙයි. මේක අනුමත කරන්න දැම්මේ. මේක මගේ වැඩකටයුතු පහසුකරගන්න ගෙනාවේ. මන්ත්‍රීවරුන්ට විරුද්ධව ගේන යෝජනාවක් නෙමෙයි මේ. එතුමාගේ කොට්ඨාශයේ, ගමේ හින්දා එතුමා විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- බය නැත්නම් ඛෙදීමකට යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමා, දැන් ඔබතුමන්ලාගේ කණ්ඩායමෙන්ම ඔබතුමා නම් කරපු පුද්ගලයාට විරෝධතාවයක් දක්වනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතුමා ජාගොඩ දේශපාලනයට එනවාටත් විරුද්ධවුන පුද්ගලයෙක්. අපිට ඒක දේශපාලන මට්ටමින් ගිහින් විසඳන්න බෑ. එතුමා කොහොමත් ජාගොඩත් එක්ක විරුද්ධයි. ඒක එතුමාගේ මතය. එතුමාගේ මතය සභාවේ මතය නොවිය යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා** ඃ- මම යෝජනා කරනවා මේ වෙලාවේ පැන නැගුන ගැටළුත් එක්ක ඔබතුමන්ලාගේ කණ්ඩායමේ මන්ත්‍රීවරයෙක් ඛෙදීමක් ඉල්ලුවේ යම් ප්‍රශ්නයක් තියෙන නිසානේ. මෙතන ඇත්තටම බහුතරය මොන පැත්තට යාවිද කියලා අපිට හිතන්න බෑ. මම කියන්නේ මේ යෝජනාව කල් තියලා ප්‍රශ්නය විසඳගෙන සුදුසු නමක් සාකච්ඡා කරලා යෝජනා කරන්න. එහෙම හොඳ විදියක් කරන්න. මේක ඛෙදීමකට ගිහිල්ලා නැති අර්බුදයක් නිර්මාණය වේවි. මම ඔබතුමාට නිහතමානීව මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම අහන්නේ මෙච්චරයි. පුද්ගලික මට්ටමින් සභාව යන්න පුළුවන්ද?. මේක සම්මත කරා කියලා සභාවට වෙන හානිය මොකක්ද?.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මට පුද්ගලිකව රවීන්ද්‍ර ජාගොඩ සමඟ කිසිම විරෝධතාවයක් නෑ. නමුත් මෙතන බහුතර මතය කුමක් වේවිද කියලා අපිට හිතාගන්න බෑ. ප්‍රියන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔබතුමා පක්ෂය ඇතුලේ සාකච්ඡා කරලා ඉදිරියේදී තීරණයක් ගන්න කියලා නිහතමානීව මේ අවස්ථාවේ ඉල්ලනවා. මේ සිද්ධිය නිසා මුළු සභාවම අපහසුතාවයට ලක් වෙනවා නැත්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, සභාවේ සභාපතිවරයා හැටියට ඔබතුමාට බලතල තියෙනවා මහජන සම්බන්ධතා නිලධාරියෙකු පත් කර ගන්න. ඒකට අපේ විරෝධයක් නෑ. ඒ අවස්ථාව ප්‍රාදේශීය සභා පනතේ ඔබතුමාට බලය දීලා තියෙනවා. නමුත් ප්‍රශ්නය තියෙන්නේ ඔබතුමා පරිත්‍යාගයක් කරලා මෙච්චරකල් ඒ පත්වීම සිදු නොකර හිටියා. ඒ ගෞරවය ඔබතුමාට තියෙනවා. සභාවේ අරමුදල් වලින් වැටුප් ගෙවමින් ඒ පත්වීම සිදු කරන්න වෙන හින්දා ඔබතුමා ඒ කරපු පරිත්‍යාගය දිගටම පවත්වා ගන්නවා නම් හොඳයි, නිවැරදියි. අපිට පත්කර ගැනීම් තිබුණ ඒවා කරගන්න බැරි වුනේ සභා අරමුදලේ මූල්‍ය ප්‍රශ්න නිසා. සභා අරමුදලින් කරන වැඩ සීමා කරලා තියෙනවා ප්‍රතිපාදන ප්‍රශ්න නිසා. මේ යෝජනාවට අපේ පක්ෂය පැත්තෙන් එකඟතාවයක් නැති බවට ප්‍රකාශ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කොහොමත් මහජන සම්බන්ධතා නිලධාරියෙක් මම පත්කර ගන්නවා මේ වැඩ කටයුතු ටික ඉස්සරහට කරගෙන යන්න. සභා අරමුදල් මේ වෙනකම් මම ආරක්ෂා කරලා දුන්නා.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියළු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් පිළිබඳ මම සලකා බැලුවා. ඒක නිසා මම ඒ ගෙනාපු යෝජනාව ලබන සභා වාරයට කල් තියනවා.

**02.** මවුන්ට්ප්ලසන්ට් වත්ත ප්‍රධාන මාර්ගය අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-**එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 03.** කපුහෙම්පල නන්දිමිත්‍ර මාවත තාර දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 04.** කපුහෙම්පල ගලගාව කන්දට විදුලිය ලබාදීම සඳහා විදුලි රැහැන් දිගු කිරීමට යෝජනා කරන අතර අවශ්‍ය ඇස්තමේන්තු විදුලිබල මණ්ඩලයෙන් ලබා ගැනිමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 05.** ශුද්ධ වූ පාස්කු ඉරිදා දින කිතුණුවන්ට එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරය පිළිකුලෙන් යුතුව හෙලා දැකීමටත් එම කුරිරු ප්‍රහාරයෙන් මියගිය අය වෙනුවෙන් ශෝකය පළ කිරීමටත්, තුවාල ලැබූ අය වෙනුවෙන් ඉක්මන් සුවය පැතීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 06.** පලාගල කන්ද ඉහළ නිවාස සඳහා ජල ටැංකියක් ඉදිකර ජලය ලබා දීමට ඇස්තමේන්තුවක් කඩිනමින් ලබා දෙන මෙන් ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය. එම යෝජනාවට මුදල් ප්‍රතිපාදන කොහෙන්ද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මෙහෙන් ඇස්තමේන්තුව ගත්තට පස්සේ ඒකට අවශ්‍ය ප්‍රතිපාදන මම හොයා ගන්නම්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔබතුමාට බොහොම ස්තුතියි. මේක මගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක් වුනත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා කොහොමත් එහෙමනේ. එතුමාගේ කොට්ඨාශයේ කරොත් තමයි ඔක්කොම ප්‍රශ්න. එතුමට අනිත් කොට්ඨාශවල කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක කණ්ඩායම් රැස්වීමෙත් කතා කරා. ඔබතුමාටත් කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔහොම තමයි කරන්න ඕන. තමුන්ගේ කොට්ඨාශයේ අනිත් අය කරන කොටත් ඒක දරා ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ස්ථිර කරලා තියෙන්නේ. ඒ දරාගැනීම තමුනුත් කරන්න ඕන. ඉල්ලා අස්කර ගන්න ඕන නෑ. ඒකට යෝජනා දාන්න කලින් හිතන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙමනම් දැන් ඇයි යෝජනාවක් ගෙනත් බෙදීමක් ඉල්ලුවහම ඒක පස්සට කල් තිබ්බෙ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කල් තිබ්බෙ කණ්ඩායමේ අනිත් අය ඉල්ලීම් කරපු නිසා. ඔයා හින්දා නෙමෙයි ඒක කරේ. ඒක මම බලාගන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**එහෙමනම් බලාගන්න. ඒ යෝජනාව ගෙනාවොත් හෙටත් මම විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයාට ගේම ව්දින බව දන්නවා. ඒකයි ඔයා විරුද්ධ. ඔයාගේ දේශපාලනයට බලපාන බව දන්නවා. ජාගොඩ ඡන්දෙ ඉල්ලන්න එනකොටත් ඔයා දේශපාලනයෙන් අයින් වෙනවා කිවුවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ජාගොඩලා දේශපාලනයට සුදුසු අයද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිවුවද? නැද්ද? දේශපාලනයෙන් අයින් වෙනවයි කියලා. ඔය බය අයින් කරගෙන දේශපාලනය කරන්න. ඉතුරු යෝජනා ඉදිරිපත් කරන්නකෝ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 07.** පැල්පොලවත්ත හරහා ජස්ටින් කන්ද මාර්ගයේ පිහිටි කලුගල් කිහිපයක් නිසා වාහන ගමන් කිරීම දැඩි අපහසුතාවයට පත්ව ඇත. J.C.B. යන්ත්‍රයක් යොදා ගෙන එම බාධාවන් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 08.** ආචාර්ය රිචඩ් පතිරණ විද්‍යාලයේ ගොඩකන්ද මාර්ගයට මුහුණලා ඇති ආරක්ෂිත වැට දිරාපත් වී ඇති බැවින්, තාප්පයක් ඉදිකිරීමට ආණ්ඩුකාරතුමාට දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මොකක්ද ඒ තාප්ප ගැටළුව.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දකුණු පළාත් සභාව විසුරුවා හැරලා තියෙන නිසා ඒ බලය තියෙන්නෙ ආණ්ඩුකාරතුමාට. ඒක පළාත් සභා පාසලක්. ඒ නිසා මුදල් වෙන්කරන්න කියලා දන්වලා යවන්න. ඒ පාසලේ ආරක්ෂාව තහවුරු කරන්න. අපේ ප්‍රාදේශීය සභාවෙන් ඒ සඳහා මුදල් වෙන් කරන්න බැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පාර කැපුවේ කවුද දන්නේ නෑ නේද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ කපපු ටික නෙමෙයි. කපපු ටිකට සල්ලි වෙන්කරලා තියෙන්නේ තාප්පේ හදන්න. පාර කැපුවෙත් මම තමයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, රිචඩ් පතිරණ විද්‍යාලය වෙනුවෙන් ඒ තාප්පය බඳින්න මමත් ලියුමක් දාලා මුදල් වෙන් කරන්න කියලා ඉල්ලුවා. ඒ පාර කපපු එක හොඳයි. එතන වංගුවක් තිබුණේ. ඇත්ත වශයෙන් කළ යුතු හොඳ වැඩක් ඒක. මමත් ඇවිත් බැලුවා. වංගුව පේන්නේ නෑ පාර කැපුවේ නැත්නම්. ඒකට මුදල් වෙන් කරන්න මමත් කතා කරා කණ්ඩායම් රැස්වීමේදී. ඒ වැඩේ කොහෙන් හරි කරන්නයි වුවමනාව තියෙන්නේ. එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 09.** ගැමුණු මාවත පොදු ළිඳ අසල මාර්ගය හරහා සිලින්ඩරයක් කඩා වැටී ඇති බැවින් ජලය පිරී පවතී. මදුරු අවධානමක් පවතින බැවින් සිලින්ඩර් යොදා හෝ ජලය බැස යාමට කටයුතු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 10.** වටරැක බටහිර පොල් කොරටුව පාර ඒ.බී.සී. මිශ්‍රණය යොදා උස්කර ඇති නිසා එම පාර භාවිතා කිරීමට අපහසු වී ඇත. එම නිසා ප්‍රාදේශීය සභාවේ කම්කරු මහත්වරුන් යොදවා තාර බැරල් දෙකක් පමණ පාවිච්චි කර මාර්ගය පිළිසකර කිරීමට යෝජනා කරමි.

මේ පාර කාලයක් තිස්සේ යන්න බැරුව තිබිලා ඒ.බී.සී. දාලා පාර ඉස්සුවා. පහුගිය කාලේ පළාත් සභා අරමුදල් වලින් ඒ පාර අලුත්වැඩියා කරන්න ඇස්තමේන්තුවකුත් හැදුවා. නමුත් ඒවා කෙරුනේ නෑ. මොකද පළාත් සභාවෙන් සල්ලි එවුවේ නෑ. දැන් ඒ පාරේ යන්නම බැරි නිසයි මම මේ යෝජනාව කරන්නේ. සභාවේ ලොකු අරමුදලක් නැති බව මම දන්නවා. ඒ නිසා ප්‍රාදේශීය සභාවේ කම්කරු මහත්වරු යොදවලා තාර බැරල් දෙකක් විතර දාලා මේ පාරේ යන්න පුළුවන් විදියට සකස් කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. දැන් ඒ.බී.සී. දාලා තියෙන නිසා අපේ සභාවේ ගල් රෝල භාවිතා කරලා ඒ මාර්ගය සකස් කරලා දෙන්න කියලා මම ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 11.** ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගේ භාවිතය සඳහා අලුත්වැඩියා කරන ලද කාමර කොටස මන්ත්‍රීතුමන්ලාගේ භාවිතය සඳහා වෙන් කර දෙන මෙන් යෝජනා කරමි.

දැන් ඇත්තටම අවුරුද්දකට වැඩි කාලයක් ගත වුනා සභාව පත්වෙලා. නමුත් තාම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට නිල කාමරයක් හම්බ වුනේ නෑ. ඒක දැන් අලුත්වැඩියා කරලා තියෙනවා. ඒකට විසඳුමක් ලබා දෙන්න කියලා ඉල්ලලා සිටිනවා. අපිත් ඇවිල්ලා ඉන්නේ සභාපතිතුමාගේ මේසේ ළඟ හරි ලේකම් මහත්තයාගේ මේසේ ළඟ හරි, තාක්ෂණ නිලධාරීන්ගේ මේසේ ළඟ හරි තමයි. අපිට වැඩ කරන්න වෙලා තියෙන්නේ එහෙමයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම උප සභාපතිතුමත් එක්ක සාකච්ඡා කරලා තීරණයක් ගන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම 1997 ඉඳන් ප්‍රාදේශීය සභාව නියෝජනය කරනවා. අපි ඒ ඉල්ලීම එදා ඉඳලම කරා. අපිට මේ වෙනකනුත් හම්බ වුනේ නෑ හැබැයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි නැවතිලා හිටියා උප සභාපතිතුමාට කාමරයක් තිබුණනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කාරණය ඉෂ්ට කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 12.** වැලිපිටිමෝදර, ලේකම්වත්ත, අම්පිටිය නසීම් මහතාගේ නිවස අසලින් ඇති වැසි ජලය එකතුවන කාණු පද්ධතිය අවහිර වී ඇති නිසා ඩෙංගු උවදුර ඇති වීමට හේතුවන බැවින් වතුර බැස යන ආකාරයට සකස් කරන ලෙස යෝජනා කරමි.

තාක්ෂණ නිලධාරි ගුණසේකර මහත්තයා ඒ කාණුව බලලා ඒක කොන්ක්‍රීට් කරන්න ඇස්තමේන්තුවකුත් හදලා තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 13.** අප ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන සංවර්ධන යෝජනා පළාත් පාලන සහකාර කොමසාරිස්වරිය මඟින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර අනුමත කිරීම අනවශ්‍ය බැවින් සභාව මගින් අනුමත වීම ප්‍රමාණවත් බැවින්, ඒ සඳහා අවශ්‍ය ආයතන හා නිලධාරීන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි සභාපතිවරු සාකච්ඡාවක් ඉල්ලලා තියෙනවා ගරු ආණ්ඩුකාරතුමාගෙන්. එතනදී ඉදිරිපත් කරන්න තියෙන ප්‍රමුඛ කාරණාවක් තමයි මේක.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 14.** මීපාවල ප්‍රාදේශීය සභා උප කාර්යාලය ඉදිරිපිට (වී.සී. පාර) කලංසූරිය මහත්මියගේ නිවස අසල ජලය බැසයාමට මාර්ගය කාණු සමඟ බෝක්කු දමා සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 15.** පන්විල සිට්ට්‍රස් හන්දිය දක්වා දිවෙන මාර්ගයේ චන්ද්‍රා මහත්මියගේ නිවස අසල සිට කාණු පද්ධතිය සැකසීමට යෝජනා කරමි.

මේ සඳහා ඇස්තමේන්තු සකස් කර දෙන ලෙසත් ඉල්ලීම කරනවා මේ වෙලාවේදීම. කලිනුත් ඉල්ලීම් කරා තාම ලැබුනේ නෑ මට.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ- 16.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සියලුම ජනතාවගේ ආරක්ෂාව සඳහා බුර්කාව (Burka) හා නිකාබය (Niqab) තහනම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ යෝජනාවට මම සංශෝධනයක් එකතු කරන්න ඕන. බුර්කාවයි හා නිකාබයයි කියන්නේ දෙකක්. බුර්කාව කියන්නේ මුහුණ සම්පූර්ණයෙන් වහන එකට. ඒකට අපිත් විරුද්ධයි. රජය කියනවානම් ඒක අපි අනුගමනය කරන්න පක්ෂයි. නිකාබය කියන්නේ හිස ආවරණය කරන එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අවසරයක් තියෙන්න ඕනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ කියාස් මන්ත්‍රීතුමාගේ සංශෝධනය ඇත්තටම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිකාබය කියන්නේ ඇස් දෙක විතරක් පෙන්වන එකට නේද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඇස් දෙක විතරක් පෙන්වන එකට අපිත් විරුද්ධයි. සම්පූර්ණයෙන්ම මුහුණ පේන්න තියෙන්න ඕන. බුර්කාව තහනම් කරන්න ඕන. නමුත් නිකාබය තහනම් කරන්න බෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** නිකාබය කියන්නේ මොකක්ද එතකොට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** මුහුණ පේන්න හිස ආවරණය කරන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක තහනම් කරන්න කියන්න බෑ. බුර්කාව පමණක් තහනම් කරන්න එහෙම නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ៖-** සන්ග්ලාස් දාන්න, මාස්ක් දාන්න බෑ හැබැයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** මේ සම්බන්ධව ටිකක් කතා කරන්න ඕන. මේ යෝජනාව ගේන්න හේතුවක් ඇතිනේ. දැන් මේක අරගෙන මුස්ලිම් ජනතාව සම්බන්ධ කාරණයක් නිසා මහ ලොකු ප්‍රශ්නයක් කර ගන්න එපා.

මේ සංවිධාන වලට අපි අද නෙමෙයි එදා ඉඳලම විරුද්ධයි. මේ සංවිධානය වලට විරුද්ධව අපි කටයුතු කරා 2006 ඉඳලම. තවුහිද් ජමාද් සංවිධාන වලට අපි විරුද්ධයි. තවුහිද් ජමාද් සංවිධාන ඇවිත් මුලින්ම ප්‍රශ්න ඇති කරේ අපේ ආගම ඇතුළේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මන්ත්‍රීතුමා බුර්කාව කියන්නේ සම්පූර්ණයෙන්ම මුහුණ වහන එකට. නිකාබය කියන්නේ ඇස්දෙක විතරක් පේන්න තියලා මුහුණ වහන එකට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** ඒක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** චදූර් කියන්නේ මුහුණ පේන්න තියෙන එකට. නිකාබය කියන්නේ ඇස්දෙක විතරක් පේන්න තියෙන එකට. බුර්කාව කියන්නේ සම්පූර්ණයෙන්ම මුහුණ වහන එකට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** අපි කියන්නේ සම්පූර්ණ මුහුණම පේන්න තිබිය යුතුය කියලා. සම්පූර්ණයෙන්ම මුහුණු ආවරණය කරන ඇඳුම් තහනම් කරන්න කියලා එම යෝජනවා මම සංශෝධනය කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ៖-** එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** මේ සංවිධානවලට අපි 2006 ඉඳන් විරුද්ධ වුන අය. පහුගිය දවස්වල ගිංතොට ප්‍රදේශයේ ප්‍රශ්න රාශියක් ඇතිවුනා. ගහගත්තා, මරාගත්තා, කොටාගත්තා, කපාගත්තා. පාස්කු ඉරිදා ප්‍රහාරයට පසුගිය ආණ්ඩුව වගේම මේ ආණ්ඩුවත් වග කියන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** මේ සංවිධාන ගැන අපි ලිඛිතව දැනුම් දුන්නා. පිටරටින් සල්ලි එනවා මේ අයට. මේ අය ආගම විකෘති කරනවා. මේ සම්බන්ධව අපි ලිඛිතව දැනුවත් කරා. ආණ්ඩුව ඒ වුනාට ඒකට ක්‍රියාමාර්ග ගත්තේ නෑ. ඒ ක්‍රියාමාර්ගයක් ගත්තේ නැති නිසා පෝෂණය වෙලා, පෝෂණය වෙලා කැලි කිහිපයකට කැඩිලා මේ තත්ත්වයට පත් වුනේ. මේ සිද්ධිය ගත්තම මේ සංවිධාන වලට මුස්ලිම් ජනතාවගෙන් 1% ක් වත් සම්බන්ධ නෑ. එකසිය ගණනක් තමයි මේ සංවිධාන වලට සම්බන්ධ වෙලා ඉන්නේ ලංකාවෙන්ම. ඒ සංවිධාන සම්පූර්ණයෙන්ම තහනම් කරත්, අපිට කිසි ගැටලුවක් නෑ. අපි ඒ සංවිධානවලට විරුද්ධයි. එස්. ටී. ජේ. කියනවා එන්. ටී. ජේ. කියනවා සී. ටී. ජේ. කියනවා නොයෙකුත් සංවිධාන තියෙනවා. ටී. ජේ. හැම සංවිධානයකටම අපි විරුද්ධයි. අපි සාම්ප්‍රදායික මුස්ලිම් ජනතාව. ආගම විකෘති කරලා මේ තත්ත්වයට පත් කරලා තියෙන්නේ. අපේ මුස්ලිම් ආගමේ සියදිවි හානිකර ගැනීම් තහනම්. ඒක හලාම්. තමන්ට ලැබුණ දරුවෙක් නැති කරන එක තහනම්. ඒකත් හලාම්. ජිහාඩ් කියන්නේ අපේ ආගමේ යම් කිසි ගැටලුවක් මතුවුනොත් ඒක නිසා යුද්ධයක් ඇති වුනොත් ඒ යුද්ධයේදී විරුද්ධ පාර්ශවය විසින් තමන් මැරුවා නම් ඒක තමයි ජිහාඩ් කියන්නේ. එහෙම නැතුව තමන් බෝම්බ බැඳගෙන ගිහින් මරාගෙන මැරෙන එක නෙමෙයි ජිහාඩ් කියන්නේ. ඒ අයගේ මරණයක්වත් පල්ලිය භාර ගත්තේ නෑ.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ៖-** ඒ අය මන්ත්‍රීතුමන්ලාගේ පල්ලි වලට ආවේ නැද්ද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නෑ. අපේ පල්ලි වලට ඒ අය ගත්තේ නෑ. තව්හිද් ජමාද් පල්ලි වෙනම තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගාල්ල දිස්ත්‍රික්කයේත් තියෙනවාද එහෙම පල්ලි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ තව්හිද් ජමාද් පල්ලි තහනම් කරන්න කියලා අපි කියන්නේ. ඒවා අලුතින් ඉදිකරපු පල්ලි. වෙනම ආගමක් අරන් ඇවිත් අපේ ආගම විකෘති කරා ඒ කට්ටිය. අපේ ආගමේ බෝම්බ බැඳගෙන ගිහින් මැරෙන්න කියලා කවදාවත් කියලා නෑ. ජිහාඩ් කියන්නෙත් ආගමක යුද්ධයක් ඇති වුනොත් ඒ යුද්ධයට අපි ඉදිරිපත් වෙලා සතුරා අතින් තමන් මැරෙනවාට. බෝම්බ බැඳගෙන ගිහින් මැරෙන එක ජිහාඩ් නෙමෙයි. ඒක නිසා තමයි අර මිනිස්සුන්ගේ මරණයක්වත් පල්ලියට භාර ගත්තේ නැත්තේ. වැරදි මතයක් පැතිරිලා තියෙනවා මුස්ලිම් ජනතාව කේන්ද්‍ර කරගෙන. මුස්ලිම් ජනතාව මේ සංවිධාන දැඩි සේ හෙලා දැක්කා. අපි එදා ඉඳගෙන කිවුවා මේ අය ආගම විකෘති කරනවා කියලා. අපේ උදුල මන්ත්‍රීතුමා නිකායවල් වලට විරුද්ධ වෙනවානේ. ඒ වගේ තමයි මේවා ආවේ ටික ටික. ඒ අයට සල්ලි ආවා. ඒ සල්ලි බෙදාගන්න බැරුව තමයි ඒ අයගේ සංවිධාන කැලි වලට කැඩුනේ. ඒක නිසා ගරු සභාපතිතුමනි, සම්පූර්ණ මුස්ලිම් ජනතාව දිහා වැරදි කෝණයකින් බලන්න එපා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා මම දැනගන්න කැමතියි කන්‍යාවියෝ 72 ක් දෙනවා කියලා කියපු කතාව ගැන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පට්ටපල් බොරු කවුද කියන්නේ එහෙම දෙයක්. එහෙම කන්‍යාවියෝ 72 ක් ලැබෙනවා කියලා කතාවක් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමන්ලාගේ පල්ලි වලින් කඩු 47 ක් හම්බ වුනා. ඒක ගැන මොකද කියන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට මම උත්තර ලබා දෙන්නම්. මෙතුමා මතුකරපු නිසා ඒක ගැන මම පැහැදිලි කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔක දිගින් දිගටම යන්න ඕන කාරණයක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුළු ලංකාවම සෝදිසි කරලා කඩු හම්බවුනේ පල්ලි දෙකකින්. කොළඹ පල්ලියෙන් කඩු හම්බ වුන සිද්ධියේදී ඒ මන්ත්‍රීතුමාගේ ගෝලයා කඩු විකුණන මනුස්සයෙක්. කඩු 300 ක් ගෙනල්ලා ඉතුරු වුන කඩු 47 ඒ. එතුමා කොළඹ බිස්නස් කරන්නේ. කොළඹ බිස්නස් කරහම ගමේ මිනිස්සු ගිහින් රෑට යනකොට බඩු ටික පල්ලියෙන් තියලා යන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** අර ඇමතිතුමා කිවුවේ තණකොල කපන්න ගෙනාපු කඩු කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක නිවැරදි කරානේ එතුමා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එක ඇමති කෙනෙක් කිවුවා කැලෑ කපන්න ගෙනාවයි කියලා. තව කෙනෙක් කිවුවා සුසාන භූමි සුද්ද කරන්න ගෙනාවයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දිගින් දිගටම යනවා. ඇති දැන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතුමා කිවුවේ ඒක නෙමෙයි. සුසාන භූමිවල කැලෑ හැදුනම ඒකට ගෙනල්ලා තියෙනවා කියලා කිවුවේ. පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. අර කොළඹදි හම්බ වුන කඩුව කැපෙන කඩුවක් නෙමෙයි. දෙපැත්තම කැපෙන්නේ නැති කඩු. වැරදි චිත්‍රයක් රූපවාහිනියෙන් ගෙනිච්චේ. ඒ තත්ත්වය බරපතල නිසා ඒ කඩු ටික ගෙනල්ලා අර මනුස්සයා පල්ලියේ කාමරයක් ඇතුලෙන් තියනවා.

කුරුණෑගලින් හම්බ වුන කඩු ගැනත් තියන්නම්. හජ්ජි අවුරුද්දට අපි කුරුභාම් කරනවා. හැම පල්ලියම ගව ඝාතනය කරලා කුරුභාම් කරනවා. ඔක්කොම එකතු කරලා එක තැනක තමයි කුරුභාම් කරන්නේ. සභාපතිතුමා දන්නවානේ ඒක. පර්මිට් ලොකු ප්‍රමාණයක් දාලා ඒක කරන්නේ. ඒකට ගෙනල්ලා තිබුණ පිහි ටික තමයි කුරුණෑගලදී හම්බ වුනේ. මාධ්‍ය වලින් පෙන්වන විදියට අපිට මුකුත් කරගන්න බෑ. කොළඹ කොහේද ළිඳකින් කඩු වගයක් ගොඩ ගන්න කොට පෙන්නනවා

පල්ලිය. හිරු ටීවී එකෙන් පෙන්නුවේ. ඒ කඩු ගොඩ ගත්තේ ළිඳකින්. පෙන්වන්නේ පල්ලිය. පල්ලිවල කවදාවත් කඩු තියාගෙන ඉන්නේ නෑ. මට තව තොරතුරු තියෙනවා කියන්න. මම ලියාගෙන ආවේ. ඔබතුමා වෙලාව දෙන්නේ නැති නිසා මම කතා කරන්නේ නෑ. මට කතා කරන්න අවස්ථාවක් දුන්නොත් මට පුළුවන් මේකේ සත්‍යතාවය නිවැරදි කරන්න. අපිට ඕනම දේකට රට තමයි මුල් වෙන්න ඕන. රට මුලින්ම. වර්තමානයේ මාධ්‍ය හැසිරෙන්නේ එහෙම නෙමෙයි. සමහර මාධ්‍ය රට ගැන කල්පනා කරන්නේ නෑ. තමුන් යැපෙන මාධ්‍ය ගැන විතරයි කල්පනා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මාධ්‍ය වාරණය කරන්න බෑ මන්ත්‍රීතුමා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තමන්ට විරුද්ධව යෝජනා එනකොට මාධ්‍යයට චෝදනා කරන්න එපා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවා ගිය ආණ්ඩුවයි, මේ ආණ්ඩුවයි දෙකම මේකට වගකියන්න ඕන කියලා. එතකොට මේකට රිෂාඩ් බදූර්දීන් ඇමතිතුමා නේද වගකියන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රිෂාඩ් බදූර්දීන් ඇමතිතුමා නෙමෙයි. මේකට සම්පූර්ණයෙන් වගකියන්න ඕනේ හිස්බුල්ලා ඇමතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ අනවශ්‍ය කාරණාවක්. මම ඔබතුමා කියන එක කාරණයකට එකඟයි. මේක මෙතනින් නවත්වන්න ඕන. සමස්ත මුස්ලිම් ප්‍රජාව මේකට වගකියන්න ඕන නෑ. ඒකට අන්තවාදි කොටසක් විතරයි වග කියන්න ඕන. මුස්ලිම් අන්තවාදීනුත් ඉන්නවා. සිංහල අන්තවාදීනුත්, දෙමළ අන්තවාදීනුත් ඉන්නවා. ඒ සිද්ධ වෙච්ච ප්‍රශ්නයේදී සමස්ත මුස්ලිම් ජනතාව මේකට වගකියන්න ඕන නෑ. නමුත් ඔබතුමා කියන අනෙක් කාරණයට මම එකඟ නෑ. වර්තමාන ආණ්ඩුව සම්පූර්ණයෙන්ම මේ ප්‍රශ්නයට වගකිව යුතුයි. හේතුව මම කියන්නම්. මේ ආණ්ඩුව බලයට ආවට පස්සේ මේ රටේ ආරක්ෂාව පිළිබඳ තැකුවේ නෑ. ආරක්ෂාව අතඇරලා තිබුණේ. මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව මේ ආණ්ඩුව ග්‍රහණය කර ගෙන ඉන්නේ. මේ අන්තවාදී මුස්ලිම් නායකයෝ කීප දෙනෙක්, ඇමතිවරු කීපදෙනෙක් වර්තමාන රජය ග්‍රහණය කරගෙන තියෙන්නේ. සමස්ථ මුස්ලිම් ප්‍රජාව නෙමෙයි. ඉතිං ඒක තුල මේ රටේ ආරක්ෂාව බිංදුවටම වැටුණා. මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම වගකිව යුතුයි මේ ඇතිවුණ තත්ත්වයට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමාගේ ප්‍රකාශයට මම පොඩි එකතු කිරීමක් කරන්නම්. ඔබතුමා කියන්නේ සම්පූර්ණ වගකීම මේ ආණ්ඩුව සතුයි කියලා. එතකොට විල්පත්තුව දුන්නේ මේ ආණ්ඩුවද?. තව්හිද් ජමාද් කියන සංවිධාන කොළඹට එක්ක ගෙන ඇවිල්ලා ගෝඨාභය රාජපක්ෂ ලොකු පෙළපාලියක් තියලා ලොකු උත්සවයක් තිබ්බා කොළඹ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ නෑ ඒ බොරු කතාවක්. මම කියන්නේ මේ ත්‍රස්තවාදය ඇති කලේ මේ වර්තමාන ආණ්ඩුව.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කතා කරන්න ඉඩ දීලා කතා කරන්න. මේ බැනර් එකක් සභාවේ ප්‍රදර්ශනය කරනවා. ඔබතුමා කියන්න බලන්න මංගල සමරවීර ඇමතිතුමා කරපු ප්‍රකාශය මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක සිංහල බෞද්ධ රටක් නෙමෙයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක සිංහල බෞද්ධ රටක් නෙමෙයි කියලා මොකේද කිව්වේ ?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මාධ්‍යයෙන් අපිට දුන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද මාධ්‍යය ? මොකක්ද මාධ්‍යය කියලා කියන්නකෝ. මන්ත්‍රීතුමා අමතක කරන්න එපා මේ දේ. මේක සිංහල බෞද්ධයන්ට විතරක් නෙමෙයි

සියලු දෙනාටම අයිති රටක් මේක. ලෝකේ උනත් එහෙමයි. ඒක නිසා කරුණාකරලා ඒ මට්ටමට යන්න එපා. ඒක හොඳ නෑ. මගේ අදහස ආගම කියන්නේ පෞද්ගලික දෙයක්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ මේක සිංහල බෞද්ධ රටක් නෙමෙයි කියලද ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාලාගේ පක්ෂයේ මතය කියන්නකෝ. මෙතුමලාගේ පක්ෂයේ මතය මේ රට බෞද්ධ රටක් නෙමෙයි කියන එක. මෙතුමාලාගේ පක්ෂයේ මතය තමයි මංගල සමරවීර ඇමතිතුමා ප්‍රකාශ කරේ. මේක බෞද්ධ රටක් නෙමෙයි කියන එක මෙතුමලාගේ පක්ෂයේ මතය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එකක් තියෙනවා. මේවා ගෙනැල්ලා කරේ විනාශයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කවුද මංගල සමරවීර ඇමතිතුමාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මංගල සමරවීර ඇමතිතුමා නෙමෙයි. අපි මේ ගැන බොහොම විවෘතව කතා කරමුකෝ. අපේ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ, යේසුස් වහන්සේ, මුහම්මත් මොහොමඩ් තුමා, ඒ අය දාර්ශනික තලයේ ඉඳපු මිනිස්සු. ඒ කවුරුවත් නරක දෙයක් කියලා නෑ. ඒවා පරිහරණය කරන අය ඒ දේවල් වැරදියට පරිහරණය කරනවා. බෞද්ධ දර්ශනයත් එක්ක අපේ මේ රටේ කොයි තරම් නිකායවල් තියෙනවද. ඒ වගේම මුස්ලිම් ආගමෙත් තියෙනවා. කවුරුවත් මේකට නරකක් කියන්නේ නෑ. හැබැයි එකක් තියෙනවා. ක්‍රිස්තියානි ආගමේ මේ දේවල් මීට වඩා වෙනස්. ඒකෙත් නරකක් කියලා නෑ. අපි බොහොම ලෝකෝත්තර විදියට මැරුණට පස්සේ මොකද වෙන්නේ කියලා හිත හිත යනවා. ඒ මිනිස්සු ලෞකික ජීවිතය හරියට ගෙවනවා. ලෞකික ජීවිතය හරියට ගෙවනකොට ලෝකෝත්තර ජීවිතය ඉබේම හැදෙනවා.

අපේ බුදුරජාණන් වහන්සේ ලොකු තැනක ඉපදුනේ. පස්මහ බැලුන් බලලා ඉපදුනේ. හැබැයි යේසුස් වහන්සේ මොන කුලේ ඉපදුනාද කියලා කවුරුවත් කියනවද. මොන කුලේද දන්නේ නෑ. දාර්ශනිකයෙක්. මෙයා ඉදිරිපත් කරා දේවල්. බුදුරජාණන් වහන්සේගේ කතාව බැලුවම, පස්මහ බැලුන් බලලා ලොකු තැනක ඉපදුනාම කියන දේ තමයි පිළිගන්නේ. කන්ද උඩට ගිහින් කිවුවම හැමෝටම ඇහෙනවා. අද ලෝකේ ජනගහනය කී දෙනෙක් මේ ආගම අදහනවද බලන්න. ක්‍රිස්තුස් වහන්සේ වඩුවගේ පුතා. කී දෙනෙක් ලෝක ජනගහනයෙන් ඒ ආගම අදහනවද.

අද කිසිම ආගමක් අදහන්නේ නැති ලෝකේ කොයිතරම් ජනතාවක් ඉන්නවද. නෝර්වේ, ඩෙන්මාර්ක්, ස්වීඩන් වගේ රටවලට යන්න. ඒ රටවල පල්ලිත් තියෙනවා. පන්සලුත් තියෙනවා. හැබැයි මිනිස්සුන්ගෙන් 2% යි ආගමක් අදහන්නේ. කිසි කෙනෙක් ආගමක් අදහන්නේ නැති වුනාට හොරකමක් කෙරෙන්නේ නෑ. පරිසරය සුරකීම ඉතා ඉහලයි. මේ හින්දා මේක අල්ලගෙන මැරෙන්න හදන්න එපා.

මෙහේ ඉන්න කාදිනල්තුමාට අපේ නායක හාමුදුරුවරුන්ට වගේ නෙමෙයි. අපේ හාමුදුරු කෙනෙක් වරදක් කරාම මහනායක හාමුදුරුවරු විනය ක්‍රියා මාර්ග අරගෙන තියෙනවද ඉතිහාසයේ කොහේවත්. හැබැයි පාප් වහන්සේ ඒ ක්‍රියා මාර්ග ගන්නවා. වතිකානුවේ තියෙනවා ක්‍රිස්තියානි සභාවක්. ඒක නිසා එක්තරා හැදියාවකට හැදිලා තියෙනවා. හැබැයි එතුමා අල්ලගත්තා අර ඇමතිතුමා ඇයි මේක කිවුවේ නැත්තේ කියලා. තාත්තා පල්ලියට යන්න එපා කියලා බේරුණා කියලා කිවුවම. එතුමා දැක්කේ නැද්ද මේවා දැනගෙන ඉඳපු මිනිස්සු ක්‍රියා නොකරේ ඇයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ගැන කතාව අනවශ්‍ය පැත්තට ගියා වැඩියි මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මේක තමයි සත්‍යය. අද දවසේ මම කතා කරේ මුකුත් හින්දා නෙමෙයි. මේවා මේ සභාවල කතා කරන්න ඕන. මේවා යන්න ඕන ඉහලට. අපේ ගෞරවණීය හාමුදුරුවරු යෝජනාවක් ගෙනාවා. ඒවා ඉහලට යන එක හොඳයි. මම කලිනුත් කිවුවා. මේක කරන්න හොඳ දෙයක් වුනාට මේක යෝජනා කරන්න හොඳ දෙයක් නෙමෙයි. ඒවා පාලනය වෙන ක්‍රමයක් තියෙනවා. ඉතිං ඇත්තටම මේ ගිනි ගන්න වෙලාවක්. ග්‍රෝතික අදහස් වලින් මිදෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන දේ පැහැදිලියි මන්ත්‍රීතුමා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ- 17.** පෝද්දල දෙණිය මංසන්දියේ බෝක්කුවක් ඉදිකර වතුර බසින ලෙස කාණු කැපීමටත් එම දුර ප්‍රමාණය පමණක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

පෝද්දල දෙණිය කොටුවේ කඩේ පාරේ මංසන්දියක් තියෙනවා. ලොකු වතුර වලක් එතන. එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදලා කාණුව සකස් කරා වතුර බැස යන්න. එක් පුද්ගලයෙක් ඒකට විරුද්ධතාවය දක්වපු නිසා පොලීසිත් ගියා මම. දැන් ඒ ප්‍රශ්නය සමතයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා එතන බෝක්කුවක් යොදලා ඒ කාණුව කොන්ක්‍රීට් කල යුතුයි. මම හැමදාම යෝජනා ඉදිරිපත් කරන්නේ නෑ. මේක කළයුතුම වැඩක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ- 18.** දිරාගිය වීථි ලාම්පු මාරු කිරීම සඳහා වීථි පහන් කට්ටල 50ක් මාගේ ප්‍රතිපාදන යටතේ මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 19.** කිතුලම්පිටිය කොට්ඨාසයේ අවශ්‍ය ස්ථානවල සවි කිරීම සඳහා වීථි පහන් කට්ටල 50ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 20.** පලාගල කන්ද බුදු පිළිමය ඉදිරිපිට මාර්ගය ආරම්භවන ස්ථානයේ ඇති කාණුවේ පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 21.** රත්නගිරිවත්ත වට රවුම් පාරේ කොටසක් තාර දමා සංවර්ධනය කිරීමටත් අවශ්‍ය ස්ථාන සඳහා සිලින්ඩර් යෙදීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 22.** පලාගල කන්ද පළමු පටුමගේ දුමින්ද මහතාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 23.** තුන්හිරිපාන ප්‍රජා ශාලාව සෑදීමට සහා අරමුදලින් රුපියල් ලක්ෂ දෙකක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 24.** රත්නගිරිවත්ත පැලවත්ත ප්‍රධාන මාර්ගය ආරම්භයේ ආරියපාල මහතාගේ නිවස අසල පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 25.** කිතුලම්පිටිය එගොඩවත්ත ගල්කැටිය මාර්ගය එගොඩහවත්ත මාර්ගය ලෙස නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 26.** පලාගල කන්ද අතුරු මාර්ග සියල්ල පිළිවෙලින් I, II, III, IV, V, VI පටු මඟවල් ලෙස නම්කර අදාල නාම පුවරු සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණියගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 27.** ලබුදූව අතුරු ඇල මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ශුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 28.** ලබුදූව කුරුන්ද කන්ද පිවිසුම් මාර්ගය (ලක්ෂ්මන් මහතාගේ නිවසට යන මාර්ගය) සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ- 28.** ලබුදූව කුරුන්ද කන්ද පිවිසුම් මාර්ගය (චින්තක ප්‍රියදර්ශන මහතාගේ නිවසට යන මාර්ගය) සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම යෝජනා තුනක් ඉදිරිපත් කරා ඔබතුමාට තියෙන බලතල අනුව ඔබතුමා යෝජනා දෙකක් අයින් කරලා තියෙනවා. මම ඒ යෝජනා දෙක මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස කියවන්නම්.

පළවෙනි යෝජනාව තමයි සහෝදර මන්ත්‍රීවරුනි, බැකෝ යන්ත්‍රය අළුත්වැඩියාවේදී අක්‍රමිකතාවයක් සිදු වී ඇතැයි විශ්වාස කරන බැවින් ඒ පිළිබඳ විගණකාධිපති වෙත පරීක්ෂණයක් සිදු කරන ලෙස යෝජනා කරමි.

මම මේකෙන් අදහස් කරේ නෑ කිසිම වෙලාවක, එහෙම අදහසක් එන්නෙත් නෑ, මේ සභාවේ කවුරුවත් වරදක් කරා කියලා. ප්‍රසම්පාදන වැඩපිළිවෙලක් තුල J.C.B. යන්ත්‍රයේ අළුත්වැඩියාව සිදු කරන්න අදාළ ආයතනයට භාර දුන්නා. නමුත් ඔබතුමාලා හිතන්න දැන් මාස කීයක් වෙනවාද මේ බැකෝ යන්ත්‍රය හදන්න යවලා. මේකට ලක්ෂ කීයක් හිරකරලා තියෙනවාද? මේ මුදල් අපේ බැංකු ගිණුමක දාලා තිබුණා නම් අපිට කොයිතරම් ආදායමක් එනවාද?. මේකට අපි පරීක්ෂණයක්

ඉල්ලන්නේ නැත්නම් වැඩක් තියෙනවාද?. ඉල්ලන්නේ විගණකාධිපතිගෙන් පරීක්ෂණයක්. ඒකෙන් සභාපතිතුමාටවත් ප්‍රශ්නයක් වෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාට පරීක්ෂණයක් ඉල්ලන්න බාධාවක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** මම පරීක්ෂණයක් ඉල්ලනවා. ඒක වෙන කතාවක්. අපේ මන්ත්‍රීවරු ටික අත්සන් කරලා මම ඒක කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි විසින් අපිට පරීක්ෂණ දාගන්න ඕන නෑ නේ මන්ත්‍රීතුමා. සභාව ඒකමතිකව තීන්දු කරලා මිල ගණන් කැඳවලා J.C.B. යන්ත්‍රයේ අළුත්වැඩියාව සිදුකරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** අපි ඒකමතිකව සභා සම්මත කරේ කොන්දේසි හරියට කරලා වගකීමක් එක්ක දෙනවා නම්. එහෙම නෑ. එහෙම නැත්නම් අපි ඒකට පරීක්ෂණයක් ඉල්ලන්නේ නැතුව මොකද කරන්නේ. ඇයි සභාව පරීක්ෂණයක් ඉල්ලන්නේ නැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අපි අපිට පරීක්ෂණයක් ඉල්ලන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** ඒ ගැන මම පොඩි අදහසක් දක්වන්නම්. J.C.B. යන්ත්‍රය හදන්න කලින් මුදල් කමිටුවට ඉල්ලීමක් ආවා මේ සම්බන්ධව. ඒ වෙලාවේදී මම අහපු ප්‍රශ්නය තමයි මේක හැදුවට පස්සේ කැඩුනොත් මොකද කරන්නේ කියන එක. ලක්ෂ 11 ක පමණ මුදලක් වැය වෙනවා කිවුවා මේ අලුත්වැඩියාවට. මේ J.C.B. යන්ත්‍රය විකුණලා සභාවට අලුත් J.C.B. යන්ත්‍රයක් ගන්න බැරිද කියලා මම ඇහුවා. එතකොට ලේකම්තුමා පැහැදිලි කරා නඩු කටයුත්තක් තියෙන නිසා මේක විකුණන්න බැරි බාධාවක් තියෙනවා කියලා. මේක අපිට හදාගත්තොත් ඉදිරියේදී වැඩ කරන්න පුළුවන් කිවුවා. ඇත්තටම ඒක අගය කරනවා. නමුත් හදපු හැටියෙම ඒ යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම ප්‍රශ්නයක්. ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රීතුමා මතුකරන කාරණාවේ ඇත්තක් තියෙනවා. සභාවක් හැටියට අපි වගකියන්න ඕන. ඒක ගෙනාපු හැටියෙම අනෙක් පැත්තට කැඩෙනවා නම් ඒකෙන් වැඩක් නෑ. අවුරුද්දක වගකීම් කාලයක් තියෙනවයි කිවුවා අලුත්වැඩියාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වගකීම් කාලයක් තියෙනවා. අපි නැවත මුදල් ගෙවීමක් කරන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** අපිට ඒ අය J.C.B. යන්ත්‍රය හදලා දෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු මන්ත්‍රීතුමා හදලා දෙන එක නෙමෙයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** හදලා ගෙනාපු ගමන් කැඩෙනවානම් ඒකත් ප්‍රශ්නයක් නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඔව් ඒක ප්‍රශ්නයක්. ඒක ගෙනාවේ වඩම්මව ගෙන මිසක් එහෙම නැතුව පාරේ ආවේ නෑ. වඩම්මවගෙන ආවේ. ඔබතුමන්ලාට එන චෝදනාවක් නෙමෙයි මෙතන තියෙන්නේ. ඉංජිනේරුවෝ ඉන්නවා. එයාලා මොකද කරේ. ඒ ආයතනය මොකක්ද කරේ. ඒ ආයතනයෙන් අපිට අයකර ගන්න පුළුවන් හරියට ක්‍රියා කරොත්. අපි දැන් මාස ගාණක් ඒක හදන්න මුදල් යට කරලා තියෙන්නේ. ඇයි අපිට ඒකට පරීක්ෂණයක් ඉල්ලන්න බැරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ සතියේ ඒකට විසඳුම හම්බවෙනවා. අඩුපාඩුවක් හරි වෙන ප්‍රශ්නයක් හරි ආවොත් පරීක්ෂණයක් ඉල්ලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** තව මාස තුනකින් හතරකින් ප්‍රශ්නයක් ආවොත් ඒක අපේ සේවකයෙක්ගේ වැරැද්දක් කියලා කියනවා මිසක් ඔබතුමන්ලා තියා කවුරුවත් කියන්නේ නෑ මේක ඒ ආයතනයේ වැරැද්ද කියලා. කැඩිච්ච එකට හේතුව ඒ ආයතනය අපිට කියන්න ඕන. එතකොට මොකක්ද ඒක ගැන ඒ ආයතනය කියන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒකට තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් අපිට දෙනවාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක කැඩීමට හේතුව පිළිබඳ එයාලා මොකද කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතුව විදියට පිස්ටන් එකක් හරස්වීම තමයි කියන්නේ. පිස්ටන් එක හරස්වීම නිසා ඒක කැඩිලා. එන්ජිම කොළඹ යවලා ඒක නිවැරදි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පිස්ටන් එකක් කැඩුනේ ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට හේතුව අපිට කියන්න තේරෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බොහොම පැහැදිලිව සභාවේ තීන්දුවක් ගත්තේ සියල්ල බලලා අපිට කාලයක් යනකම් අලුත්වැඩියා කටයුතු කරන්න බෑ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දිගින් දිගට යන්න ඕන නෑ. මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව න්‍යාය පත්‍රයට දැම්මේ නෑ. යෝජනාවක් එනවානම් න්‍යාය පත්‍රයෙන් එන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට දැනුම් දුන්නා මේ යෝජනා දෙක න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ නෑ කියලා. නමුත් මේක බොහොම පැහැදිලිව ඔබතුමාට මම පෞද්ගලිකව කිවුවා. ඇයි මේක මෙහෙම කරන්නේ කියලා. ඔබතුමා මේ වගේම තමයි ඒක තේරුම් ගත්තේ. මේ ප්‍රශ්නයේදී සභාව වැරැද්දක් නෙමෙයි කරලා තියෙන්නේ. ඉංජිනේරුවයි වැරැද්ද කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව වැරැද්දක් කරලා නැත්නම් ඔබතුමා පරීක්ෂණයක් ඉල්ලන්න. ඔබතුමාට ඒ පරීක්ෂණය ඉල්ලීමේ අයිතිය තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ ප්‍රේමලාල් අබේසේකර කියන මනුස්සයා ඉල්ලන පරීක්ෂණයද වඩා බලගතු, සභාව විසින් ඉල්ලන පරීක්ෂණයද වඩා බලගතු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා සභාවක් විදියට පරීක්ෂණයක් ඉල්ලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඉදිරිපත් කරන්නේ මොකක්ද අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඉදිරිපත් කරන්නේ විගණකාධිපතිට දන්වලා වහාම පරීක්ෂණයක් ඉල්ලන්න. උසාවියකට හරි යන්න ඕන අපිට මේ තරම් පාඩුවක් උනා කියලා. මේ ආයතනය පාඩමක් ඉගෙන ගනීවි. අපේ සභාවට මූල්‍ය පාඩුවක් වුනානේ. අපිට මූල්‍යමය හානියක් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා. මේ පිළිබඳ ලේකම්තුමාට සභාව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- J.C.B. යන්ත්‍රයේ එන්ජිම පූර්ණ අලුත්වැඩියාවක් සිදු කළ බව
- පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරුතුමාගේ උපදෙස් පරිදි අලුත්වැඩියාවෙන් පසු J.C.B. යන්ත්‍රය වෙනත් වාහනයක පටවා සභාව වෙත රැගෙන ආ බව.
- J.C.B. යන්ත්‍රයේ අලුත්වැඩියාව සම්බන්ධව පරීක්ෂණයක් සිදු කළ යුතු නම් එය පළාත් පාලන කොමසාරිස් හරහා සිදු කළ යුතු බව.

- මීට අමතරව J.C.B. යන්ත්‍රයේ අලුත්වැඩියාව පිළිබඳ මන්ත්‍රීවරුන්ට ඇති ගැටළුද සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාලා මේ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගත්තේ නෑ. ඔබතුමාලා මේක ගැන පරීක්ෂණයක් ඉල්ලන්නේ නැත්තේ ඇයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි පළාත් පාලන කොමසාරිස්ට දැනුම් දෙන්නම් පරීක්ෂණය සිදු කරන්න. වෙන අයට බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක වරදවා තේරුම් ගන්න බෑ. පළාත් පාලන කොමසාරිස්ට යවනවා කියන්නේ, පොඩ්ඩක්වත් වැරදි අර්ථකථනයක් දෙන්න එපා. පළාත් පාලන කොමසාරිස් හොරා කියලා නෙමෙයි මම කියන්නේ. හොරාගේ අම්මාගෙන්ද මේ පේන අහන්නේ. ඒ අයමනේ මේකට සම්බන්ධ වුනේ. පළාත් පාලන ඉංජිනේරුවරයාට විරුද්ධව පරීක්ෂණයක් ඒ අය කරනවාද ? මේක සම්බන්ධව විගණනයක් කරන්න ඉල්ලලා යවන්නේ නැතුව කාගෙන්ද පරීක්ෂණයක් ඉල්ලන්නේ. මේක ඇයි සභාවට ඉල්ලන්න බැරි. සභාව වැරැද්දක් කරලා නෑ. ඔබතුමා වැරැද්දක් කරලත් නෑ. ඇයි එහෙම තියෙද්දි මේ වගේ පැහැදිලි දේකට ක්‍රියා කරන්න බැරි.

ඊළඟට දෙවෙනි යෝජනාව ගැන මම විස්තරයක් කරන්නම්. තරංගා ලැන්ඩ් සේල් සමාගම හපුගල වතුර ටැංකිය පාරේ වෙන්දේසි කරපු ඉඩම සම්බන්ධව ඔබතුමාලාගේ සම්බන්ධයක් නෑ. ඒකට සම්බන්ධ නාගරික සංවර්ධන අධිකාරිය. ඒකට විරුද්ධව පරීක්ෂණයක් කරන එකේ ගැටළුව මොකක්ද? ඒකට පරිසර වාර්තාවක් අරගෙනත් නෑ. ඒකට පරිසර වාර්තාවක් අවශ්‍ය නැත්නම් බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ කිසිම ඉඩමකට පරිසර බලපත්‍රයක් ගන්න අවශ්‍ය නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ටිකක් පැහැදිලි කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හපුගල වතුර ටැංකිය පාරේ තරංගා ලැන්ඩ්ස් ආයතනය කරන ලද වෙන්දේසි ඉඩම හා හිරිඹුර, හිරිඹුර එක පැත්තකට දාන්නකෝ හපුගල වතුර ටැංකිය පාරේ ඉඩම වෙන්දේසි කරේ සභාව නැති කාලේදීනේ. එතකොට ඒකට පරීක්ෂණයක් ඉල්ලන්න පුළුවන්නේ. කොහොමද මේවට අවසර ලබා දුන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පරීක්ෂණයක් කරාට ප්‍රශ්නයක් නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට පරීක්ෂණයක් කරන්න සභාවෙන් ඉල්ලීමක් කරන්න. ඕන දේකට ලෑස්තියි කියලා ඔබතුමා ගිය සභාවේදි කිවුවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් ඒක ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ සම්බන්ධව වහාම පරීක්ෂණයක් සිදු කරන්න කියලා විගණන දෙපාර්තමේන්තුවට දැනුම් දෙන්න.

**31.** ඉඩමක් වෙන්දේසි කිරීමට ප්‍රථම ගරු සභාව දැනුවත් කරන මෙන් යෝජනා කරමි.

ප්‍රථම කියන්නේ ඉඩම කපලා කොටලා ඉවර උනාට පස්සේ නෙමෙයි. මන්ත්‍රීවරුන්ට බලාගන්න යෝජිත වෙන්දේසි ඉඩමක් ආවහම ඒ සම්බන්ධව සභාව දැනුවත් කරන්න. යූ.ඩී ක්ලියරන්ස් ගන්න සභාවට එනවානේ. එතකොටම සභාවට දාලා මේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න. රොස්වුඩ් වෙන්දේසි ඉඩම ගැන කලින් දන්නවා නම් මේ සියලු මන්ත්‍රීවරු ඒකට විරුද්ධ වෙනවා. ඒක වෙන්දේසි කරලා ඉවර වුනාට පස්සේ තමයි අපි දන්නේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා. ඔක්කොම කරලා ඉවර වුනාට පස්සේ සභාව දැනුවත් කරලා වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අර මීපාවල අමරදිවාකර මහත්තයලගේ ගෙවල් වලට යන ලියනගේවත්ත පාරේ කරපු වෙන්දේසි ඉඩමෙන් වෙන්කරපු මුදල් සභාවට ගෙවලා තියෙනවා. ඒ මුදල් මේ සභාවේ තියෙනවා. ඒ සල්ලි වලින් පාර පළල් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඕනම තැනක ප්‍රවේශ මාර්ගය ලොකුවට තියෙන්න ඕන. මේකේ ප්‍රවේශ මාර්ගය පොඩියි. ඇතුලේ මාර්ග ලොකුයි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ මුදල් සභාවට බැඳලා තියෙනවා. හෙච්චා හෙච්චා ලිපිගොනුව නෑ. ඔබතුමාලගේ මන්ත්‍රීතුමත් ගිහින් ඒ පාර බැලුවා. එතුමාගේ ප්‍රතිපාදන වලින් ඒ පාර හදනවා කිව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ පාර අරන් දෙන්න ඕන. ගෙවපු මුදල් වලට මොකද වුනේ කියලා හොයන්න ඕන. ඒ පාර හදන්න විදියක් නෑ. පාරේ හැඩේ පුනීලයක් වගේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා මෙහෙමයි. විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ගිහින් මීපාවල ලියනගේවත්ත මාර්ගය රන්මාවත් යටතේ කාපට් කරන්න හරි පුළුල් කරන්න බැලුවා. ඒ පාරේ පළල අඩි නමය හමාරයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ මුදල් සභාවට බැඳලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මෙහේට සල්ලි ගෙවලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගෙව්වද නැද්ද කියලා හොයලා බලන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒකට සම්බන්ධ ලිපිගොනුව මම උප කාර්යාලයේත් බැලුවා. ප්‍රධාන කාර්යාලයෙත් බැලුවා. නමුත් තව වෙනතුරු ලිපිගොනුව හොයා ගන්න බැරිවුනා. ආරංචි විදියට ලක්ෂ 04 ක මුදලක් ෆිනෑන්ස් ආයතනය මඟින් සභාවට ගෙවලා තියෙනවා. ඒ සම්බන්ධ ලිපිගොනුව අද වෙනතුරු හොයා ගන්න නෑ. පැතිබැම්ම දාලා තාප්පය බඳින්න මම සභාවට යෝජනා කරාම ඒ ලිපිගොනුව හෙව්වා. හම්බ වුනේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා කොයි කාලේද ඒ සල්ලි සභාවට බැඳලා තියෙන්නේ. 2013 දී වගේද. ඒ ෆිනෑන්ස් ඉඩම කරේ 2013 දී 2014 දී වගේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** 2012 දී වගේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ සම්බන්ධව හොයලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගැන හොයලා බලන්න මොකද වෙලා තියෙන්නේ කියලා.

**<u>ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය ඃ- 32.** උළුවිටිකේ කොට්ඨාසයේ වීථි ලාම්පු සවි කිරීම සඳහා වීථි ලාම්පු කට්ටල 50ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

33. උළුවිටිකේ සන්සයිඩ් ගාර්ඩන් දෙවන පටුමගේ පිවිසුම සඳහා බෝක්කුවක් දැමීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා, අපි එදා සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරා නාවින්න නරිදූව මාර්ගය පුළුල් කිරීම යටතේ කාපට් කරන්න. අපි ඒ පාර තාක්ෂණ නිලධාරීතුමත් එක්ක ගිහින් බලන්න ඕන අවහිර තැන් ටික. ඒක තාම

වුනේ නෑ. ඉදිරි දිනයකදී අපි යමු ඒ පාර බලන්න. හෙට අනිද්දා වෙනකොට ඒ පාරේ වැඩ පටන්ගන්න තියෙන නිසා පාර අවහිර කරලා තියෙන වාහන ටික අයින් කරලා දෙන්න ඕන. අපි ලබන සෙනසුරාදා වගේ ගිහින් මේ පාර බලමු. පාරේ වැඩ පටන් ගන්න බෑ වාහන ගොඩගහලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වාහන ටික අයින් කරමු. ඒක ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** පාරට අවහිර තැන් ටික තාක්ෂණ නිලධාරී එක්ක ගිහින් බලන්න දිනයක් කතාකර ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සෙනසුරාදාට යමු.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** කලේගාන දකුණ ග්‍රාම නිලධාරි වසමේ කාර්යාලය පොළ භූමිය තියෙන කඩ කාමරයකට ග්‍රාම නිලධාරිතුමා විසින් රැගෙන ඇවිත් තියෙනවා. එතුමා දැන් ඒ කාර්යාලයේ තමයි රාජකාරි කටයුතු කරන්නේ. එතන තියෙනවා කිවුවා ලොකු කසළ ගොඩක්. මේ ගැන සභාවට කීපවරක් දැනුම් දුන්නා කිවුවා. නමුත් තාම ඒක කෙරිලා නෑ. ඒ කසළ ගොඩ අයින් කරලා එතුමාට එතන පිරිසිදු කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා, අපි ස්තූතිවන්ත වෙනවා සභාවට. පාරක් ප්‍රීමික්ස් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරා සභාපතිතුමාගෙන්. සභාපතිතුමා ඉතා උනන්දුවෙන් ඒ පාර ප්‍රීමික්ස් කරලා දුන්නා. තාක්ෂණ නිලධාරිතුමත්, ලේකම්තුමත් ඒ කටයුත්ත සඳහා ඉතා උනන්දුවෙන් වැඩ කටයුතු කරා. දැන් ඒ පාර ලස්සනට තියෙනවා. ප්‍රීමික්ස් මදි වුනා. පොඩ්ඩයි ඒ අය ගෙනාවේ. තව පාරේ ටිකක් ප්‍රීමික්ස් කරන්න තියෙනවා. ඒ ටිකත් ප්‍රීමික්ස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ පාරේ මිනිස්සු සතුටින් ඉන්නේ ඒ කරපු වැඩේට. සභාපතිතුමා, තාක්ෂණ නිලධාරිට මේ ගැන ටිකක් මතක් කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා, මගේ කොට්ඨාශයට ප්‍රීමික්ස් ටිකක් ලැබුනේ නෑ. ඒක මොකක් හරි කරලා ඉවර කරලා දෙන්න.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>**

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ කණ්ඩායම් රැස්වීමේදී ගනිපු තීන්දුව අනුව අපේ කණ්ඩායම විදියට අපි සියලු දෙනාම මේකට එකග නෑ. අපි මේ කිසිම ගෙවීමකට සම්බන්ධයක් නෑ. අපි කිසි කමිටුවක ඇත්තෙත් නෑ. මේ වගකීම් වලින් අපිව මුදා හරින්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් ඡන්දයකට යන්න වෙනවා.

**<u>01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019-05-07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දයකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 07

**2019-05-07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය

09. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-05-07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-05-07 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත විය.

<u>**02. කර්මාන්ත හා සේවා කමිටුව**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019-05-07 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 07

**2019-05-07 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-05-07 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-05-07 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත විය.

**<u>03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019-05-07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 07

**2019-05-07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-05-07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-05-07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත විය.

**04. පරිසර කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- I.** 2019-05-07 දින පැවති පරිසර කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 15

විපක්ෂව - 07

**2019-05-07 දින පැවති පරිසර කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
05. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
08. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
09. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-05-07 දින පැවති පරිසර කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-05-07 දින පැවති පරිසර කමිටු වාර්තාව වැඩි ඡන්ද 08 කින් සභා සම්මත විය.

**(ඉ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ අප්‍රේල් මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස.6)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ අප්‍රේල් මස ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ මාර්තු මස හා අප්‍රේල් මස සංසන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>04. වෙනත් ලේඛන</u>

<u>I. ප්‍රගතිය</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ මැයි මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ප්‍රගතියේදී ඇත්තටම නැවතත් කියන්න වෙන්නේ අඬලා හිනාවෙන්න තමයි. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතකද අපිට පොරොන්දු වුනා ඔබතුමා වතුර ප්‍රශ්නය පිළිබඳ ගොඩකන්ද ප්‍රදේශයේ ගෙදර ගැටළුව මතුවුණාම ජල සම්පාදන මණ්ඩලයට යන්න දින වකවාණු අපි කතා කර ගත්තා. මීට සභා වාර කීපයකදීම මේ සිද්ධිය වුනා. එතකොට ඔබතුමා කිවුවා මම දිනයක් ලබා දෙන්නම් කියලා. බෝපෙ පෝද්දල ජනතාවට දරුණු අසාධාරණයක් වෙනවා. ඇත්තම කතාව කිවුවොත් සමහර අය අපිට විහිළු කරනවා. ආණ්ඩුව අපේ හින්දා අපිට වතුර අරන් දෙන්න කියලා ඉල්ලීම් කරනවා. ඉතිං ඒක කෙරෙන්නේ නෑ. ඩඩ්ලි මන්ත්‍රීතුමා මේක ගැන උරණ වෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතුමාගේ ශක්තිය විතරයි ගන්න පුළුවන්. එතුමත් දැන් විශ්‍රාම ගියා. මම එතුමාගෙන් දුරකථන අංකය ඉල්ලා ගෙන කතා කරා. අලුත් ඩී.ජී.එම්. කෙනෙක් දැන් ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ එකක්වත් වැඩක් නෑ සභාපතිතුමා. පළවෙනියට කරන්න ඕන වෙලාවල් ඉල්ල ඉල්ල ගිහින් කතා කරන එක නෙමෙයි. පළවෙනියට කරන්න තියෙන්නේ අපි එනවා කියලා ගිහින් ජල සම්පාදන මණ්ඩලය වටලලා අපි මෙතනින් යන්නේ නෑ කියලා උද්ඝෝෂණය කරන එක. පළවෙනියට විරෝධතාවය එන්න ඕන. ඒක මාධ්‍යවලින් යාවි. එතකොට බලයි මොකද වෙලා තියෙන්නේ කියලා. අපිට මිනිස්සු විහිළු කරනවා වතුර අරගෙන ඉවර වෙලා මන්ත්‍රීතුමාටත් ඕනනම් කියන්න වතුර අරගෙන දෙන්නම් කියලා. ඔබතුමා අරන් දුන්නේ නෑ අපි වතුර ගත්තා කියනවා. මේකයි ඇත්ත තත්ත්වය. එක් කෙරුනේ නෑ. මේක හරි කණගාටුදායක තත්ත්වයක්.

නඩු දැමීම පිළිබඳ ප්‍රශ්නයේදී ගරු සභාපතිතුමනි, මට නම් තේරෙන්නේ නෑ. තව වෙනකම් මේවා හරියට කෙරිලා නෑ. ඒක හරි දුර්වලකමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනය සම්බන්ධව තාප්පයට නඩු දාන්න ඉන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාප්පයේ නෙමෙයි ප්‍රශ්නය තියෙන්නේ ප්‍රධාන ගොඩනැගිල්ලේ. දැන් ඒ ලිපිගොනුව තියෙනවාද? නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාප්පයේ ලිපිගොනුව තියෙනවා. ගොඩනැගිල්ලේ ලිපිගොනුව තමයි නැත්තේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ලිපිගොනුව තියෙනවා කියලා කිවුවනේ. හිටපු නිලධාරීන්ට විරුද්ධව ලිපිගොනු නැතිවීම් පිළිබඳ වෙනම ඉතිහාසයක් තියෙනවානේ. ලිපිගොනු නැතිවෙන්න අවුරුදු ගාණකට කලින් සභාවට දැනුම් දුන්නා. ලිපිගොනු නැතිවෙනවා ආයේ එනවා. ආපහු යනවා. ආයේමත් එනවා. ඒවාට ගනිපු ක්‍රියාමාර්ගයක් නැනේ. එකම දේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වෙන එක විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඡායා පිටපත් අඩංගු ලිපිගොනුවක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ලිපිගොනුව කවුරුහරි හොරකම් කරලා. ඒකට වගකියන්න ඕන. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ විතරක් නෙමෙයි ලිපිගොනු ගණනාවක් නැති වුනානේ. අංක 46/1, වී.සි පාරේ ලිපිගොනුව නැතිවුනා. දැන් ඒ ලිපිගොනුව තියෙනවා. ඒ ඉදිකිරීමට අදාළව නඩු දැමීම සඳහා ක්‍රියාමාර්ග ගත්තද?. මූලික නීතියම කඩලා තියෙන්නේ. අධිබල විදුලි රැහැන් පද්ධතිය යට ගෙවල් හදන්න බෑ. පරීක්ෂණයට ආව පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ට කිවුවේ ලිපිගොනුව නැතිවෙලා කියලා. අධිබල විදුලි රැහැන් පද්ධතිය යට හැබැයි නිවසක සැලැස්ම අනුමත කරලා තියෙනවා. එකම දේ ගරු මන්ත්‍රීවරු දැනගන්න ඕනේ ප්‍රශ්නයක් ආවම ස්ථාන මාරුවක් හම්බ වෙනවා. මෙතනින් අක්මීමණ ප්‍රාදේශීය සභාවට යනවා නැත්නම් හබරාදූව ප්‍රාදේශීය සභාවට යනවා. එච්චරයි වෙන්නේ. මේ පිළිබඳව ඇත්තටම සභාපතිතුමනි එළියට බැහැලා ඔබතුමා මේ ගැටලු වලට ක්‍රියාමාර්ග ගන්නේ නෑ කියලා තමයි කියන්න වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම සභාපතිතුමා විදියට තාක්ෂණ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාලට තියෙන වගකීම ඉෂ්ට කරන්න. කිසිම කෙනෙකුගේ තරාතිරම බලන්නේ නැතුව නඩු දාන්න. මම නඩු දාන්න එපා කියලා නෑ. ලබන සභාවට ප්‍රගතිය ඉදිරිපත් කරන්න. නඩු දාන්න සුදානම් කරලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපෙන් අවශ්‍ය සහය ගන්න කියන්න ඕන වෙලාවක. මේ ප්‍රධාන අනවසර ඉදිකිරීම් වලට නඩු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා තාක්ෂණ නිලධාරිතුමාට අනවසර ඉදිකිරීම් වලට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ඒ. පී. පී. එස්. ගුණසේකර මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- අනවසර ඉදිකිරීම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පෙර සිහිකැඳවීම් යැවීමේ අවශ්‍යතාවය
- මීට අමතරව මන්ත්‍රීවරුන්ට අනවසර ඉදිකිරීම් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, මම අත්‍යවශ්‍ය ඉල්ලීමක් විදියට ඉල්ලනවා. හැම දවසකම ඊරියගහ හන්දියේ හදිසි අනතුරු එකක් දෙකක් වෙනවා. ඒක යෝජනාවක් විදියට නෙමෙයි ඔබතුමාගේ වගකීමක් විදියට ඉෂ්ට කරන්න. මේ හන්දියට බම්පර් දෙකක් පෞද්ගලිකව මැදිහත් වෙලා ඕපාත පාරටයි, බටුවන්තුඩාව පාරටයි දාලා දෙන්න. මොකද නැත්නම් හැමදාම කවුරුහරි හදිසි අනතුරකට භාජනය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ස්ථාන දෙක හරියටම කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බටුවන්තුඩාවේ ඉඳලා ඊරියගහ හන්දියට වැටෙන පාරටයි, ඕපාත ඉඳලා ඊරියගහ හන්දියට වැටෙන පාරටයි, මේ පාරවල් දෙකේම එන අය අනතුරුවලට භාජනය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බටුවන්තුඩාව පාරේ එක කරමු. ඕපාත පාරේ එක නොකර ඉඳිමු. ඒ පාරේ හැප්පෙනවා නම් හැප්පෙන්න ඕනේ එක්කෙනයි. ඒක වෙන්නේ නෑ.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අවසාන වශයෙන් මම ඔබතුමාට එකක් කියන්න ඕන. මේ ඉන්නේ සිංහල බෞද්ධයෝ ටික සියලු දෙනාම. හැබැයි මම දකින දකින බෝ ගහටයි, නා ගහටයි වඳින්න යන්නේ නෑ. ඉතාම කණගාටුදායක සිද්ධියක් වුනා. ඔබතුමා ආපස්සට හැරිලා බලන්න කාගේද වැරැද්ද කියලා. ඇත්තටම මේක ඔබතුමාගේ වගකීමක්. ඔබතුමා ඒක පටවන්න ගියා වැඩකරන ජනතාවට. වැඩකරන ජනතාවට ඒක පටවලා තේරුමක් නෑ. මේක සාවදානව අහන්න. ඒ වගකීම කාටවත් පටවලා තේරුමක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව් අනිවාර්යයෙන්ම. අද ඉඳන් මම ඒකට ක්‍රියාමාර්ගයක් ගන්නවා. ඒ වැරැද්ද නැවත නොවෙන්න. මන්ත්‍රීවරුන්ටත් යම් වගකීමක් යුතුකමක් තියෙනවා. ගේම් ගහන එක විතරක් නෙමෙයි. මට මේක ගැන එක මන්ත්‍රීවරයෙක් දැනුවත් කරේ නෑ. මාව අපහසුතාවයට පත් කරන්න වැඩ කටයුතු කරා මිසක්. එක මන්ත්‍රීවරයෙක්වත් මාව දැනුවත් කරේ නෑ. සභා භූමිය වෙසක් පෝයට ආලෝකමත් වෙලා නැත්නම් මට චෝදනාවක් එනවා වගේම ඒකෙන් කොටසක් මන්ත්‍රීවරුන්ටත් එනවා. එක මන්ත්‍රීවරයෙක්වත් මට කිවුවද සභාව අඳුරේ කියලා. වෙසක් එකට සභාවේ මොනවා හරි කරමු කියලා යෝජනා කරපු එක මන්ත්‍රීවරයෙක් කියන්නකෝ. හෘද සාක්ෂියට එකඟව වැඩ කරන්න. මේකේ ගේම් ගහන්නනම් ඉන්නවා පැනගෙන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ එක දෙයක්වත් වෙන්නේ නෑ ඔබතුමා නිවැරදි නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම නිවැරදි වෙන්නම්. ඒ වැරැද්ද මම නිවැරදි කර ගන්නම්. අද සිට මම ඒ ගොනා වික්කා. මේ දිනේ ලියලා තියා ගන්න. 2019.05.21 ඉඳන් සභාපතිතුමා ඒ ගොනා වික්කා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා එක දවසක්වත් මගෙන් අහලා තියෙනවාද අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමාගේ පැත්තේ ඇතිනේ ලයිට් නැති තැන් කියන්න කියලා. එක දවසක්වත් කියලා තියෙනවාද? නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආණ්ඩු පක්ෂයේ අය විරුද්ධයිනේ ඔබතුමාට ලයිට් එකක් දෙනවාට. මේ සියලු දෙනා විරුද්ධයි. ඒක මගේ තනි තීරණයක් නෙමෙයි. මේ ඉන්න එක මන්ත්‍රීවරයෙක් නැගිටලා කියන්න කණ්ඩායම් රැස්වීමේදී කියලා තියෙනවද විපක්ෂයට ප්‍රතිපාදන දෙන්න, විපක්ෂයට ලයිට් දෙන්න කියලා. ගේම් ගහන්න විතරයි මේ සභාවට පුළුවන්. ඇත්ත කතාව ඒක. ඒක පොදු තීන්දුවක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම යෝජනා කරනවා හොර හොරා දෙන්නේ නැතුව මන්ත්‍රීවරු විසිදෙදෙනාටම ප්‍රතිපාදන දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොර හොරා දෙන්නේ නෑ. උදුල මන්ත්‍රීතුමයි, ප්‍රියන්ත මන්ත්‍රීතුමයි ඉල්ලීම් කරන්න. අනෙක් අයට ඉස්සරහට බලමු. ඔබතුමාලා යෝජනා දෙන්න. වීථි පහන් ඉල්ලන්න. එක්සත් ජාතික පක්ෂයේ අය වීථි පහන් දාන්න ඕන ස්ථාන කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඇහුවේ එක්සත් ජාතික පක්ෂයට නෙමෙයි. ප්‍රේමලාල් අබේසේකරට දෙනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමත් දාන්න ඕන ලයිට් තියෙනවානම් දෙන්න. එතකොට බලමුකෝ මේක යන විදිය. ඩබල් ගේම් ඔක්කොම ගගහ යන විදිය මම පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා අපිට නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් ඉල්ලීම් දෙන්න. දාන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හැබැයි සභාපතිතුමා මම මේ කාටවත් දෙනවාට විරුද්ධ වෙලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම විතරයි එතකොට කියලා තියෙන්නේ. එහෙම නම් සුගත් මන්ත්‍රීතුමා එකඟද දෙනවට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මගේ කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ප්‍රසිද්ධියේ කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බලන්න සටන් කරන්න ඕන ඉල්ලීම් දිනා ගන්න. අපේ සභාපතිතුමාට ජය වේවා. අපේ සභාපතිතුමාට ජය වේවා.

ගරු සභාපතිතුමා මට සමාවෙන්න. පහුගිය දවස්වල කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ නඩු දාපු වාර්තාව රැගෙන එන්න බැරිවුනා. මම පොරොන්දු වුනා ඒක ඔබතුමාට ලැබෙන්න සලස්වනවා කියලා. අද දින මම ඒ වාර්තාව සභාගත කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට ප්‍රකාශයක් කරන්න ඕන වෙසක් දිනයේ සභාව අඳුරේ තිබීම සම්බන්ධව. මට හිතෙන්නේ සභාපතිතුමාට වගකීමක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපතිතුමාට විතරයි වගකීමක් තියෙන්නේ. වෙන කාටවත් නෑ. ඒකනේ ෆේස්බුක් දාලා තිබුණේ බෝපෙ පෝද්දල අඳුරේ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සම්පූර්ණ වගකීම ඔබතුමා දරන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒක අපි හැමෝගෙම වගකීමක්. සභාපතිතුමාට විතරක් චෝදනා කරන්න බෑ. ඒකයි මම කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** උදුල මන්ත්‍රීතුමාට ඕන නම් වගකීම භාර ගන්න. අපිට ඕන නෑ. අපිට අදාළ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අබේසේකර මන්ත්‍රීතුමාට සභාවේ කිසි වගකීමක් නෑ. මොහොකවත් වගකීමක් නෑ. ඒ නිසා කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කම්කරුවෝ ඉන්නවා, නිලධාරීන් ඉන්නවා, මන්ත්‍රීවරු ඉන්නවා, මන්ත්‍රීවරියෝ ඉන්නවා, අපි හැමෝටම සභාව අඳුරේ තියෙනවා දැක්කා නම් ඒක ගැන සභාපතිතුමා දැනුවත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම අහන්න කැමතියි අප්‍රේල් සභාවේදී කවුරුවත් මන්ත්‍රීවරයෙක් මතුකරාද, ඇහුවද අපි මොකක්ද වෙසක් උත්සවය වෙනුවෙන් කරන්නේ කියලා. එතකොට මේ නිලධාරීන්, කම්කරුවෝ වෙසක් කූඩු හැදුවා. කවුරුවත් අගය කලාද?. අන්තිමට ගේම් ගහලා විදුලි කාර්මිකයෝ ගෙනියලා එන්න එපා කියලා ඔවුන්ට චෝදනා කරලා ඊට පස්සෙ සභාව අඳුරේ තියලා මේක ෆේස්බුක් දාලා මේ නම කැත කර ගත්තේ කවුද?.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, වෙසක් පෝයට දින කීපයකට කලින් මම ලේකම්තුමාට කතා කරලා ඇහුවා වෙසක් උත්සවයට සභා භූමිය ආලෝකමත් කරන වැඩපිළිවෙල හරිද කියලා. මාව දැනුවත් කලා සියල්ල හරි කියලා. පෝයට දවස් හතරකට කලින් මම ඇහුවේ. නමුත් ඒක කෙරුනේ නෑ. ඒකට සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරු වගකියන්න ඕන. ඒක අපේ අතපසුවීමක්. ඇත්තටම අපි වගකීම භාර ගන්න ඕන. හැබැයි ලේකම්තුමාගෙන් මම විමසීම කලා දවස් හතරකට කලින්.

වෙසක් පෝය දවසේ රෑ හතට විතර මම සභාවට ආවා. ඇත්තටම ලැජ්ජයි අනෙක් හැම ආයතනයක්ම විදුලි ආලෝකයෙන් සරසලා තිබුණා. අපේ සභා භූමිය අඳුරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හිතා මතා කරපු වැඩක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක කොහොම වුනත් ඔබතුමාට සියළු මන්ත්‍රීවරුන්ට ඒකේ අවලාදය ඇවිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මාව අපහසුතාවයට පත් කරන්න හිතාමතා කරපු වැඩක් උප සභාපතිතුමා. ඒක මන්ත්‍රීවරු නෙමෙයි මාව අපහසුතාවයට පත් කරන්න කරපු වැඩක්. ඒක උපක්‍රමශීලිව කරා. මම නැවත මේ තත්ත්වයට පත් වෙන්න දෙන්නේ නෑ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කපුහෙම්පල සෞඛ්‍ය සායන මධ්‍යස්ථානයේ වැඩ අවසන්. ඒකේ නාම පුවරුවක් සවි කරන්න මම යෝජනා කරා. ඊට සමගාමීව ලබුදූව ක්‍රීඩාංගනය සහ සුසාන භූමි වල නාම පුවරු සවි කිරීමටත් යෝජනා ආවා. ඒ කටයුත්ත තාම සිදු වුනේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හැබැයි ඊළඟ සභාව එනකන් ඉන්න බෑ. ඊට කලින් ඒක වෙන්න ඕන. ලේකම්තුමාටත් මම වගකීම පවරනවා. ඊළඟ සභාවට කලින් ඒ නාම පුවරු ටික සවි කරන්න ඕන. හැමදාම ඕක කියන්න බෑ. මම මේක දෙපාරක් විතර කිව්වා. ඒ වැඩ ටික ඊළඟ සභාවට කලින් මුදල් කමිටු තුනක් හතරක් හරි දාලා ඉෂ්ට කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමනි, මම නිවාස කීපයක ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ කටයුත්තක් ඉදිරියේදී කරන්න යොදාගෙන තියෙනවා. මම යෝජනාවකුත් කරා ජාතික කොඩි සහ පළාත් කොඩි මිලදී ගන්න. ඒ වගේම සමර්හට්වල රෙදි මැසීම සඳහා තව වෙනතුරු වැඩ ආරම්භ කරාද?. සමර්හට්වල අවශ්‍යතාවයක් තියෙනවා. සභාවක් හැටියට ඒ දේවල් තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට සභාවට ආදායමක් එන්නේ නෑ. වියදම් විතරයි මේ ටිකේ යන්නේ. ඒක ගැන මම බලන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා එක්ස්කැවේටර් යන්ත්‍රය යොදවලා හැම කොට්ඨාශයකම සංවර්ධන කටයුතු සිදු කරා. මගේ කොට්ඨාශයට සිලින්ඩර් වගයක් ගෙනියලා තියෙනවා. ඒවා තාම දැම්මෙත් නෑ. සුද්ද කරන්න අවශ්‍ය කාණු සඳහා යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් ඒවා ක්‍රියාත්මක වුනේ නෑ. බැදි පාරේ දාන්න තියෙන සිලින්ඩර් දෙක පුපුරලා. ඒක ගෙනල්ලා මාස ගාණක් වෙනවා. මුකුත් වෙලා නෑ තාම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන අද ලේකම්තුමා එක්ක සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න. ඊළඟ සභාවට කලින් මේ කතා කරන මාතෘකා ටික ඉවර වෙන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට සිලින්ඩර් දෙක ගැන අදාළ නෑ. පැටවීමේදී හරි ගෙනල්ලා බානකොට හරි සිලින්ඩර් පුපුරලා. ඒවා දාන්න බෑ. ගමේ ලොකු විරෝධයක් තියෙනවා ඒ නිසා නැවත ඒ සිලින්ඩර් අලුතෙන් හරි ගේන්න ඕන. වෙච්ච පාඩුව සභාව සතු කරගෙන හරි මිනිස්සුන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට වෙන්න ඕන.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** වක්වැල්ල හන්දිය ළඟ ලයිට් එකක් නෑ. එතන පොඩි හදිසි අනතුරක් වුනා. ඒ අනතුර වෙන වෙලාවේ මම එතන හිටියා. මම සභාපතිතුමාට කතා කරලා කිව්වා ඒ ස්ථානය ගැන. ඇත්තටම ඊළඟ දවසේ උදෙන්ම ඇවිත් එතන ලයිට් එක දාලා පිළිසකර කරලා දීලා තිබුණා. මම හොඳ දේ හොඳයි කියනවා. තුසිත මන්ත්‍රීතුමා අපේ ගමේ ලයිට් දාලා තිබුණා නැතිම තැන්වලට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ටත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් තමන්ට අලුතෙන් ලයිට් හයිකරන්න ඕන තැන් දෙක ගානේ මට ලබා දෙන්න.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගොඩකන්දේ සමගි මාවතේ අනවසර ඉදිකිරීමක් කරලා තියෙනවා. ඒක ඉවත් කරන්න කියලා ලිපියකින් දැනුම් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ වැඩි විස්තර ලබා දෙන්න තාක්ෂණ නිලධාරී දිනූෂ මහත්තයාට.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මට කාලේක ඉඳලා තියෙනවා විසඳගන්න බැරි ගැටලුවක්. අනවසර ඉදිකිරීමක් නිසා පාර හදාගන්න විදියක් නෑ. පාර කාපට් කරන්න හෙට අනිද්දාටම අනුමත වෙලා ඒවි. මේකට නඩු දාලා තියෙන්නේ. මට තේරෙන්නේ නෑ ඇයි මෙහෙම වෙන්නේ කියලා. මේ නඩුවේදී අනවසර ඉදිකිරීමට අයිතිකාරයෝ නෑ. නමත් වරද්දලා දාලා තියෙන්නේ. ඊට පස්සේ නිවැරදි කරලා තියෙනවා. නඩු දාලා තියෙන්නේ අදාළ නැති පුද්ගලයෙකුට. ඊට වැඩිය ඒකට නඩු දාන්නේ කාටද කියන එකත් ප්‍රශ්නයක්. අයිතිකාරයෙක් නෑ ඒකට. අයිතිකාරයෙක් ඉන්නවා නම් අයිතිවාසිකමක් තියෙන්න එපැයි. ඒ අනවසර ඉදිකිරීම ඉවත් කරලා දෙන්න මට පාර හදා ගන්න. සභාපතිතුමා ඒක ටිකක් බලන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම යෝජනාවක් දැම්මා ග්‍රාම සංවර්ධන සමිති සඳහා කොන්ත්‍රාත් ලබාදීමේදී සමිති ගිණුමේ තිබිය යුතු මුදල රුපියල් විසිපන්දහසක් දක්වා අඩු කරන්න කියලා. ඒක මම යෝජනා කරේ දකුණු පළාත් සභාවටත්, පාර්ලිමේන්තුවටත් දන්වන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ සභා තීරණය අදාළ විෂයට භාර දීලා තියෙන්නේ ඉදිරි ක්‍රියාමාර්ග ගන්න. ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා, ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා, ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය, ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.

1. පොදු ගෙවීම්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** නරාවල ප්‍රදේශයේ කසළ බැහැරලීමේ කටයුතු සඳහා ජේ.සී.බී යන්ත්‍රය කුලී පදනම මත ලබා ගැනිම වෙනුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීම. යූ.එල්. ජීවන් නදීශාන් රු.72,540.00

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

**02.** නැම් පයිප්ප කට්ටල 300 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීම. ගුරුගේ අයන් වර්ක්ස් රු. 480,000.00

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

2. කර්මාන්ත ගෙවීම් ඃ- නැත

3. සේවක ණය ගෙවීම්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** දස මස් වැටුප් අත්තිකාරම් ගෙවීම. චන්දිමා නිශාන්ති මිය රු. 158,963.00

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයට පැමිණීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමාගේ ප්‍රකාශ අතරතුර ඇයි මේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සභා ගර්භයෙන් නැගිටලා ගියේ. ඒක ඔබතුමා දැනුවත්වද සිද්ධ වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි අවසර අරගෙන යන්නේ. සභාව ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ ඉවර නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එතුමා සභා ගර්භයෙන් එළියට ගිහින් කතා කරනවා. ඒකෙන් සභාව කරගෙන යන්න බාධා මතුවෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට කතා කරන්න සම්පූර්ණ අයිතියක් තියෙනවා. අපි මේවට විරුද්ධයි. පොදු ගෙවීම්නේ යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කියලා යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කණ්ඩායම් රැස්වීමේදී කතාකරගෙන ආවේ.

<u>**III.** ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** ලබුදූව කුරුන්ද කන්ද පිවිසුම් මාර්ගය (චින්තක ප්‍රියදර්ශන මහතාගේ නිවසට යන මාර්ගය) සංවර්ධනය කිරීම. රු. 320,000.00

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**02.** ලබුදූව බාස්වත්තේ ධනංජය මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම. රු. 480,000.00

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**03.** ලබුදූව කුරුන්ද කන්ද පිවිසුම් මාර්ගය (ලක්ෂ්මන් මහතාගේ නිවසට යන මාර්ගය) සංවර්ධනය කිරීම. රු. 90,000.00

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කපුහෙම්පල නන්දිමිත්‍ර මාවත සංවර්ධනය කිරීම. රු. 705,000.00

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**05.** ලබුදූව අතුරු ඇළ මාර්ගය එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සුද්ධ පවිත්‍ර කිරීම. එක්ස්කැවේටර් පැය 50 යි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

## IV. මිල ගණන් කැඳවීම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః- 01.** ප්‍රීමික්ස් ව්‍යාපෘතියට අවශ්‍ය **8′ x 4′ x 8 mm** ප්‍රමාණයේ යකඩ තහඩු දෙකක් මිලදී ගැනීම සඳහා මිල ගණන් ඉදිරිපත් වෙලා තියෙනවා ආයතන තුනකින්.

- යූ. කේ. පී. ට්‍රේඩර්ස් - රු. 32,500.00
- එම්. ඩබ්. එස්. ට්‍රේඩර්ස් - රු. 30,500.00
- එම්. එච්. කාදර් මීසා - රු. 32,000.00

එක් තහඩුවකට අවම මිල ඉදිරිපත් වී ඇත්තේ එම්. ඩබ්. එස්. ට්‍රේඩර්ස් ආයතනයෙන්. ඒ අවශ්‍ය තහඩු දෙක එම ආයතනයෙන් මිලදී ගන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## V. ලිපි ඉදිරිපත් කිරීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః- 01.** 2019 වර්ෂයේ අධ්‍යාපන චාරිකාව සම්බන්ධව (සුහද සුභ සාධක සංගමය, බෝ.පෝ.ප්‍රා.ස)

ගිය වර්ෂයේ වගේ රු.150,000.00ක් ලබා දෙන්න කියලා ඒ ඉල්ලීම කරලා තියෙන්නේ.

සුභ සාධක සංගමයේ ව්‍යවස්ථාව අනුව ප්‍රාදේශීය සභාවට පත්වෙන සභාපති සුභ සාධක සංගමයේ සභාපති වෙන්න ඕන. අද වෙනකම් ඒක කෙරුණේ නෑ. නිලවරණයක් තියෙන්න ඕන. මන්ත්‍රීවරු සියලු දෙනා මේකට ඇතුලත් කර ගත යුතුයි. ඊට පස්සේ මේක ගැන අපි සලකා බලමු.

මම යෝජනා කරනවා සුභ සාධක සංගමයේ නිලවරණයට පවත්වා, අප ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සියලුම මහජන නියෝජිතයන් සුභ සාධක සංගමයට බඳවාගෙන 2019 වර්ෂයේ අධ්‍යාපන චාරිකාව සඳහා සභා අරමුදලෙන් ලබාදෙන දායකත්වය පිළිබඳ තීරණ ඉදිරි මහා සභාවේදී ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ః-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ః-** ගරු සභාපතිතුමනි, බොහොම කණගාටුවෙන් හෙලා දකිනවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සභා රැස්වීම අවසන් වෙනතුරු නොසිටීම සම්බන්ධව. මෙතුමන්ලට තමන්ගේ ආසනවල ඉඳගෙන මේවාට විරුද්ධ නම් විරුද්ධත්වය ප්‍රකාශ කල හැකියි. ඔබතුමාගේ නායකත්වයට පිටින් ගිහිල්ලා එළියේ ඉඳගෙන ඒ මන්ත්‍රීවරු වෙන සාකච්ඡාවක් පවත්වනවා නම් ඒක කණගාටුවෙන් යුතුව හෙලා දකිනවා. එතුමාලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු නම් සභාව අවසන් වෙනතුරු රැඳී සිටිය යුතුයි. ඒක අනිවාර්යය කරන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ః-** ඒක මට බලහත්කාරයෙන් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. ඒක තමන්ගේ කැමැත්ත. අශෝභනතාවය එතුමන්ලා සතුයි. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු වුනාට අශෝභනතාවය එතුමන්ලා සතුයි. තල වැපුරුවොත් මුං හම්බවෙන්නේ නෑ. මුං වැපුරුවොත් තල හම්බවෙන්නේ නෑ. ඔයි මට්ටමේ ඉන්න එපා අබේසේකර මන්ත්‍රීතුමා එක්කෝ ඉන්න. නැත්නම් යන්න. ඔබතුමා ඉඳලා ප්‍රකාශයක් කරන්න. නැත්නම් යන්න. ඔබතුමාලගේ පක්ෂයේ අනිත් මන්ත්‍රීවරු එළියෙන් ඉන්දලා ඔබතුමා ඇවිත් වාඩි වෙනවා. මෙතුමා හැමදාම කරන්නේ ඕක තමයි. අනිත් මන්ත්‍රීවරුන්ව අතින් කතා කරලා එළියට ගෙන්නගෙන වාඩි කරවලා මෙතුමා ඇවිත් ඇතුලෙන් වාඩිවෙනවා. හැමදාම කරේ ඔහොම තමයි. මාවත් අමාරුවේ දාන්න හැදුවා. මම ඕවාට අහුවුනේ

නෑ. එක්සත් ජාතික පක්ෂයේ සියලු මන්ත්‍රීවරු සභා ගර්භයෙන් එළියට ගිය වෙලාව සඳහන් කරන්න. පොදු ගෙවීම් පටන් ගන්නකොටම ඒ අය සභා ගර්භයෙන් එළියට ගියා.

**02.** එච්.කේ. අලස් මහතාගේ ඉඩමේ ඇති අනතුරුදායක ගස් කැපීම. ( නිරෝෂා හේමමාලී, බෝ.පෝ.ප්‍රා.ස සංවර්ධන නිලධාරී, අනතුරුදායක ගස් විෂය)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා දිගින් දිගටම සභා අරමුදලෙන් අනතුරුදායක ගස් කපලා ඉවත් කරනවා. ඒක එහෙම කරාම ඊලඟ කෙනත් එන්නේ ඒ විදියට ගස් කපන්න. ගස් හිමිකරුවන්ගෙන් වැයවූ මුදල් අයකර ගන්න ඕන. අනතුරුදායක නම් වහාම ඉවත් කරන්නත් ඕන. ඉවත් කරන ගස් එක්කෝ සභාවට ගේන්න ඕන. නැත්නම් වෙන්දේසි කරන ක්‍රමවේදයකට හරි යන්න ඕන. මේක බේරන්න බෑ. මම මේක ගැන මුල ඉඳගෙනම ඔබතුමාට කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේවා මේ අවුරුද්දක් විතර තිස්සේ ඉඳගෙන ආපු ප්‍රශ්න. එකම දෙයයි දැන් කරන්න තියෙන්නේ. මේ ගස් සභා අරමුදලෙන් කපලා නීතිමය ක්‍රියා මාර්ග ගන්න ඕන. රු.5,000.00 ගියොත් ගහ කපන්න ඒක අයකරගන්න නීතිඥවරුන්ටත් දීලා තව රු25,000.00 ක් විතර වියදම් කරලා රු.5,000.00ක් ලබා ගන්න පුළුවන්. ඔන්න ඕක තමයි නීතිමය තත්වය. අනතුර වුනොත් අන්තිම චෝදනවා එන්නේ මට. ඔන්න සභාපතිතුමාට මම කිවුවා. මෙච්චර කාලයක් වෙනවා සභාවට දැනුම් දීලා ගහ කැපුවේ නෑ. ගහ වැටිලා ගේ කැඩුනම අන්තිම චෝදනාව එන්නේ මට. ඒ හින්දා ප්‍රශ්න තියෙන අනතුරුදායක ගස් සභා අරමුදලින් හරි කපලා දාලා ඉවර කරන්න ඕන. ඊට පස්සේ රු.30,000.00ක් වගේ වියදම් වුන ඒවාට නම් නීතිමට ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරාට කමක් නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා අපිට මෙහෙම කරන්න බැරිද, අද සභාවට ඉල්ලීම් කරලා තිබුණා බොහොම අසරණ දෙන්නෙක්. ගෙවා ගන්න බැරි අයට අපි සභා අරමුදලෙන් වියදම් කරමු. අනිත් අයගෙන් අය කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දීර්ඝ කාලයක් ආව ප්‍රශ්නයක්. මගේ මතය නම් සභා අරමුදලෙන් කපලා මේ අයට නීතිමය ක්‍රියාමාර්ග ගන්න ඒ අයට විරුද්ධව සභාවට වැයවුන මුදල් නොගෙව්වොත්.

එච්.කේ. අලස් මහතාගේ ඉඩමේ ඇති අනතුරුදායක ගස් සභා අරමුදලෙන් කපා ඉවත් කරලා වැයවන මුදල් ගස් හිමිකරුවන එච්.කේ. අලස් මහතාගෙන් අයකර ගැනීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඒ වගේම තමයි සභාපතිතුමා සභා රැස්වීම අවසන් වෙනකම් දීමනාව ගෙවන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභා රැස්වීම අවසන් වෙනකම් මන්ත්‍රීවරුන්ට දීමනාව ලබා දෙන්න එපා. ඒවාට නම් අංක එක. මොනවා නැතත් දීමනාව අංක එකට ලබා ගන්නවා. මාසේ පළවෙනිදා වෙනකොට ඉන්ධන දීමනාවයි, දුරකථන දීමනාවයි ලබා ගන්න බිල් දානවා. එක පාර රු.3,000.00 බිල් දානවා. තෙල් ටැංකියට ඒ තරම් තෙල් ගහන්නත් බෑ. අපි ඕවා බලාගෙන ඉන්නවා.

**03.** වතුර බවුසරය වෙනුවෙන් සභාවට බඳින ලද මුදල් නැවත ලබා ගැනීම. (එම්.සී. නිරෝශාන්ත මයා, නො 176/4, ගල්වලගොඩ කන්ද, තල්ගස්යාය, පෝද්දල)

අපේ වතුර බවුසරය ලබා ගන්න මුදල් බැඳලා ගෙනිච්චා මල ගෙදරකට. ඒ මාර්ගයේ යන්න බෑ කියලා නැවත ගෙනාවා. ඇණවුම් කළ පුද්ගලයා වතුර බවුසරය ප්‍රතික්ෂේප කරා නෙමෙයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ වතුර බවුසරයට බැඳපු මුදලින් කොටසක් රඳවා ගත්තොත් හොඳයි නේද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඒ අයගේ වරදක් නෙමෙයි. ඒ අයගේ අදාළ කාරණාව ඉෂ්ටවුනේ නැනේ. ඒක අපි දරාගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඊට පස්සේ ඒක වෙනත් පුද්ගලයෙකුට විකුණලා තියෙනවනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඒ ලිපිය අනුව පෝද්දල, තල්ගස්යාය, ගල්වලගොඩ කන්ද, නො 176/4 ලිපිනයෙහි පදිංචි එම්.සී නිරෝශාන්ත මයා විසින් 2019-05-06 දින වතුර බවුසරයක් ලබා ගැනීමට ඇණවුම් කර තිබුණ නමුත් උක්ත ලිපිනයට වතුර බවුසරය ප්‍රවාහනය කිරීම සිදු නොකල බැවින් හා එම වතුර බවුසරය වෙනත් පුද්ගලයෙකුට සැපයීම සිදුකල බැවින් 2019-05-06 දින ප්‍රා.ස බිල්පත් අංක 415 යටතේ සභාවට බඳින ලද රු.3815.00 ක මුදල නැවත නිදහස් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** ලබුදූව ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා සභාවට බඳින ලද මුදල් නැවත ලබා ගැනීම. ( ගරු ලේකම්, සමෘද්ධි නිලධාරී සුභ සාධක සංගමය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල)

ඒ ලිපිය අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය සමෘද්ධි සුභ සාධක සංගමය විසින් 2019-04-27 දින ලබුදූව ක්‍රීඩාංගනය අවුරුදු උත්සවයක් පැවැත්වීමට වෙන් කරගෙන තිබුණද රටෙහි පැවති නොසන්සන්කාරී තත්වය නිසා එම උත්සවය නොපැවැත්වූ බැවින් 2019-04-03 වන දින ප්‍රා.ස බිල්පත් අංක 3293 යටතේ සභාවට බඳින ලද රු.2,000.00ක මුදල නිදහස් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.06.18 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.